කාර්යසාධන වාර්තාව - 2024

වැය ශීර්ෂය - 296

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

පාලක ජනරාල්ගේ පණිවුඩය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන)පනත මඟින් ස්ථාපිත ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවෙහි 2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාව නිකුත් කරන මෙම අවස්ථාවේ දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් වශයෙන් පණිවුඩයක් නිකුත් කිරීමට හැකිවීම මා ලද භාග්‍යයක් ලෙස සළකමි.

ආනයන හා අපනයන (පාලන) පනතට අනුකූලව මෙරට ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍යය, පරිසර සංරක්ෂණය ආදිය සැලකිල්ලට ගෙන තිරසර සංවර්ධිත රටක් උදෙසා ආනයන හා අපනයන ක්‍රමවේදය නියාමනය යන "මෙහෙවර" ඔස්සේ දෙපාර්තමේන්තුව මෙහෙයවීමට 2024 වර්ෂයේ දී නව ක්‍රියාමාර්ග රැසක් ආරම්භ කරන ලදී.

යථෝක්ත දිශානතික වූ කාර්යභාරය ක්‍රියාත්මක කිරීමෙහිලා අතිවිශේෂ ගැසට්පත්‍ර 16 ක් අවස්ථාවෝචිතව අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් සහ අධීක්ෂණය යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ අනුමැතිය මත නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

පෙර වර්ෂවල පැවැති, ආර්ථික අර්බුදකාරී තත්ත්වය, 2024 වර්ෂයේ දී ක්‍රමිකව යහපත් තත්ත්වයකට පැමිණීම මත, බහුතරයක් වූ ආනයන සීමා ඉවත් කිරීමට කටයුතු සිදු කරන ලද අතර, මහජන සෞඛ්‍ය සහ පරිසරය ආරක්ෂා කිරීම ආශ්‍රිත ගැටලු ඉහළ යෑම සැලකිල්ලට ගනිමින්, ආරක්ෂිත සහ ඵලදායී වෙළඳ ප්‍රවාහයන්ට පහසුකම් සැලසීමට ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන් යාවත්කාලීන කිරීම සහ නව තත්ත්ව ප්‍රමිතීන් හඳුන්වා දීමට අදාළ රෙගුලාසි සම්පාදනයකර ප්‍රකාශයට පත් කිරීමේ කටයතු යුහුසුළුව ඉටු කිරීමට, 2024 වර්ෂයේ මුල් කාර්තුවල මෙම දෙපාර්තමේන්තුවට සිදුවිය.

ආර්ථික තත්ත්වය සුබදායීවීම සහ ආනයන සීමාවන් ලිහිල් කිරීම මත පුරෝකථනය කරන ලද ආනයන ඉහල යාමද සැලකිල්ලට ගනිමින් ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රතිපත්ති රාමුව යාවත්කාලීන කිරීමට වසර ගණනාවකට පසු ආරම්භ කිරීමට හැකි වූ අතර, බොහොමයක් ප්‍රතිපත්ති වර්තමානයට ගැළපෙන පරිදි සහ සේවාලාභීන්ට පවතින නෛතික රාමුව තුළ ආනයනය ක්‍රියාවලිය කඩිනම්ව සිදු කර ගැනීමට හැකිවන පරිදි යාවත්කාලීන කිරීමට ද හැකි වීම අප ලද ජයග්‍රහණයකි.

තවද, ශ්‍රී ලංකාව එකඟ වී ඇති ජාත්‍යන්තර සම්මුතීන් හරහා සිදු කරනු ලබන, ආනයන අපනයන නියාමනය සඳහා පහසුකම් සපයමින්, ආනයන අපනයන පාලනය ද අප දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන අතර, විශේෂයෙන් බාසල්, රොටර්ඩෑම්, මොන්ට්‍රියල් වැනි සම්මුතීන් හරහා සිදු කරනු ලබන විද්‍යුත් අපද්‍රව්‍ය, හානිකර රසායනික ද්‍රව්‍ය සහ ඕසෝන් ක්ෂයකාරක ආනයන නියාමනය මෙහිදී විශේෂයෙන් සඳහන් කළ හැක. ඊට අමතරව, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1540 මඟින් නිර්දේශ කර ඇති, ජාත්‍යන්තර සාමයට බාධා විය හැකි අවි නිෂ්පාදනය සඳහා යොදා ගත හැකි භාණ්ඩ, සම්බන්ධයෙන් වන නියාමනයන් උදෙසා නිතී සම්පාදනය කිරීම සඳහා පියවර ගැනිම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති විශාලතම අභියෝගයක් ලෙස සැලකිය හැකිය. මේ වෙනුවෙන්, ක්‍රියාත්මක වීම සඳහා දැනට පවතින 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන ප්‍රමාණවත් නොවූ බව හඳුනාගත් අතර ඉන් ඔබ්බට ගිය නියාමනයක් වෙනුවෙන් උපායමාර්ගික වෙළෙඳ කළමනාකරණ පනතක් කෙටුම්පත් කිරීමට මේ වන විට කටයුතු කර ඇති අතර, එය කලාපයේ වඩාත් වැදගත් නීති සම්පාදන කටයුත්තක් මෙන්ම ජාත්‍යන්තර වෙළෙඳාම හමුවේ වැදගත් තීරණයක් ලෙසද සැලකිය හැකිය.

දෙපාර්තමේන්තුව විසින් ස්වකීය දැක්ම හා මෙහෙවර ඉදිරියට ගෙන යමින් ස්ථාවරව හා විධිමත්ව පවත්වා ගැනීම සඳහා නූතන තාක්ෂණය සමඟ මුසුවෙමින් දෙපාර්තමේන්තුව ලොව අනෙකුත් රටවල්වල තාක්ෂණික පද්ධති සමඟ එක්වීමේ කර්තව්‍යයද සාක්ෂාත් කරගැනීම සඳහා කටයුතු කර ඇත. ඒ අනුව, ඇමරිකානු එක්සත් ජනපදයේ ආධාර මත එස්තෝනියා රාජ්‍යය මඟින් සකස් කළ ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීමේ මාර්ගගත පරිගණක පද්ධතියක් අප දෙපාර්තමේන්තුවට ලබා ගැනීමට හැකිවීම අප අත්පත්කර ගත් සුවිශේෂී ජයග්‍රහණයකි. 2024 වර්ෂයේ අවසන් කාර්තුවේ දී මෙම ඉලෙක්ට්‍රොනික බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය දියත් කිරීම සිදු කල අතර, එමඟින් ශ්‍රී ලංකා රේගුව, ආනයන බලපත්‍ර ලබා ගැනීම සඳහා නිර්දේශ ලබාදෙන රාජ්‍ය ආයතන සහ බලපත්‍රලාභී වාණිජ බැංකු එකම තලයකට (Single Digital Platform) ගෙන ඒමට හැකිවීම තුළ සේවාලාභීන්ට දෙපාර්තමේන්තුවට පැමිණීමකින් තොරව බලපත්‍ර සහ හරපත්‍ර ලබා ගත හැකිවීම සහ සියලුම ක්‍රියාවලීන් නිර්ලේඛන (Paperless) තාක්ෂණයෙන් යුක්ත වීම ශ්‍රී ලංකාවේ ඩිජිටල්කරණයේ සන්ධිස්ථානයක් ලෙස සඳහන් කරමි.

ඉදිරියේ දී මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය තවදුරටත් කාර්යක්ෂම කිරීම පිණිස දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය හා එක්ව දෙපාර්තමේන්තු ක්‍රියාවලීන් අධ්‍යයනය කොට තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා වැඩ පියවර රැසක් සැලසුම්කර ඇති අතර, ඒ සඳහා කාල රාමුද සකස් කොට තිබේ.

සමස්තයක් වශයෙන්, 2024 වර්ෂයේදී අපේක්ෂිත කාර්යසාධන ඉලක්කගතයන් සපුරා ගනිමින්, දෙපාර්තමේන්තුවේ දැක්ම වෙත ක්‍රමිකව පියවර තැබීමේ මාවත මැනවින් හෙළි පෙහෙළි කරලනු වස් විධායක නිලධාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයම මා හට දැක්වූ දායකත්වය ද මෙම අවස්ථාවේදී කෘතවේදීව සිහිපත් කරමි.

තව ද, මෙම කාල පරිච්ඡේදය තුළ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ලද මාර්ගෝපදේශකත්වය ද සැළකිය යුතු වේ. එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුවේ කාර්යය හා සෘජුවම බැඳුණු , ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව හා ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු පද්ධතිය, අනෙකුත් බලපත්‍ර නිකුත් කිරීමේ දී නිර්දේශ සපයනු ලබන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහාය ස්තුති පූර්වකව මෙහි සඳහන් කරමි.

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත මඟින් ආවරණය වන නෛතික රාමුව තුළ රජයේ ආර්ථික ප්‍රතිපත්ති හා අනුගත වෙමින් පෞද්ගලික අංශය බහුතරයක් වන සේවාලාභීන්ගේ අපේක්ෂාවන් ඉටුවන පරිදි ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මෙහෙයවමින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීමට ඉදිරියටත් ඇප කැප වන්නට දෙපාර්තමේන්තුවේ අපි සියල්ලන්ම එක්ව අදිටන් කර ගනිමු.

ටී.ටී. උපුල්මලී ප්‍රේමතිලක
ආනයන හා අපනයන පාලක ජනරාල්

පටුන

1	පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1
1.1	හැඳින්වීම	1
1.2	දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු	2
1.3	දෙපාර්තමේන්තුවේ වගකීම් හා කාර්යභාරය	3
1.4	සංවිධාන ව්‍යුහය හා සටහන	4
2	පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	7
2.1	භාණ්ඩ ආනයන හා අපනයනය නියාමනය සම්බන්ධ ප්‍රතිපත්තිමය නියෝග	7
2.2	ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම	17
2.3	පසුගිය වසර තුන තුළ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය	25
2.4	ආනයන හා අපනයන ගෙවීම් ක්‍රම සහ නියෝග	28
2.5	ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන නියාමන හා පහසුකරණය	29
2.6	නව වැඩිදියුණු කිරීම්	32
3	පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	37
3.1	2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	37
3.2	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	38
3.3	2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය	39
3.4	ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය	40
3.5	2024 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය	41
3.6	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	41
3.7	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය	41
3.8	විගණකාධිපතිගේ වාර්තාව	41
4	පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය	42
4.1	ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	42
5	පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සාක්ෂාත් කරගැනීමේ කාර්යසාධනය	42
5.1	හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු	43
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	47
6	පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ	47
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	47
6.2	දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම	48
6.3	මානව සම්පත් සංවර්ධනය	48
7	පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව	54
සමාප්ති සටහන		61
ඇමුණුම (1) විගණකාධිපති වාර්තාව		

1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත පාදක කර ගනිමින් ස්ථාපිත ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වඩාත් විධිමත් හා අන්තර් ජාතික වෙළෙඳාමට සරිලන අයුරින් ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා පහසුකම් සපයන භූමිකාවක් දක්වා වර්තමානය තෙක් විකාශනය වී තිබේ. ඒ අනුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව හා අනෙකුත් අදාළ පාර්ශ්වයන්ගේ අදහස්,යෝජනා, නිරීක්ෂණ හා උපදෙස් සමඟ ඒකාබද්ධ වෙමින් අවස්ථානුකූල පරිදි සාම්ප්‍රදායික කාර්ය භාරයෙන් ඔබ්බට යමින් උපායමාර්ගික ප්‍රවේශය ඔස්සේ එකී පනතේ බලතල ප්‍රකාරව ආනයන හා අපනයන ගෙවීම් ක්‍රම නියාමනය කිරීම් හරහා සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරන ලද මෙම දෙපාර්තමේන්තුව, ආර්ථිකය මත පැවති පීඩනය පහව යාමේ ධනාත්මක ප්‍රවණතාවය පිළිබඳ අවධානය යොමු කරමින්, පනවන ලද ආනයන සීමා කිරීම් සඳහා පැවති සියලුම තාවකාලික ආනයන සීමා ඉවත් කිරීම 2024 වර්ෂයේ අවසන් කාර්තුවේ සිදු කරන ලදි.

ජාතික ආරක්ෂාව, පරිසර සංරක්ෂණය, යහපත් සෞඛ්‍ය හා ආර්ථික සුරක්ෂිතතාව අරභයා ආනයන හා අපනයන භාණ්ඩයන්හි සංඛ්‍යාත්මක හා ගුණාත්මකභාවය උදෙසා ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස සේවාලාභීන් තෘප්තිමත් වන අයුරින් ඉටු කිරීමට හැකි සෑම පියවරක්ම මෙම දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබේ. එහිදී බාසල්, මොන්ට්‍රියල් ඇතුළු පරිසරය සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතීන් හා අනුගත වෙමින් අදාළ ආනයන පාලනයන් සිදු කරන ලදි.

තවද, භාණ්ඩ ආනයනයේදී ඒවායේ ප්‍රමිතිය නිර්ණය කිරීම මඟින් මහජන සෞඛ්‍ය ආරක්ෂාවට අදාළ විධි විධාන පනවන ලද අතර, ආනයනික භාණ්ඩ 164 ක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති අනිවාර්ය කර ඇත. ඊට අමතරව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1540 ක්‍රියාත්මක කිරීම සඳහා නව නීතිරීති සම්පාදනයට පියවර ගෙන ඇත.

ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රතිපත්ති රාමුව යාවත්කාලීන කිරීමට වසර ගණනාවකට පසු ආරම්භ කළ අතර, බොහොමයක් ප්‍රතිපත්ති වර්තමානයට ගැළපෙන පරිදි සහ සේවාලාභීන්ට ආනයන ක්‍රියාවලිය නෛතික රාමුව තුළ කඩිනම්ව සිදු කර ගැනීමට හැකිවන පරිදි යාවත්කාලීන කරන ලදී.

දෙපාර්තමේන්තුව විසින් ස්වකීය දැක්ම හා මෙහෙවර ඉදිරියට ගෙන යමින්, තිරසර සංවර්ධනය වූ ගෝලීය සහයෝගීතාවය ක්‍රියාත්මක කිරීමේ අරමුණ පෙරදැරිව, සේවාලාභීන් වෙත කාර්යක්ෂම හා සඵලදායී සේවාවක් සපයනු වස්, STRATLINK ඉලෙක්ට්‍රොනික බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය ස්ථාපිත කරන ලදි.

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1 ආයතනික දැක්ම

තිරසර සංවර්ධිත රටක් උදෙසා
ආනයනය හා අපනයනය නියාමනය

1.2.2 ආයතනික මෙහෙවර

රටේ ආරක්ෂාව, ආර්ථිකය, මහජන සෞඛ්‍යය, පරිසර සංරක්ෂණය ආදිය සැලකිල්ලට ගෙන, භාණ්ඩ ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත අනුව ක්‍රියාත්මක කිරීම.

1.2.3 අරමුණු

රටේ ආරක්ෂාව තහවුරු කිරීම, ආර්ථිකය නංවාලීම සහ මහජන සෞඛ්‍යය හා පරිසරය ආරක්ෂා කිරීම සඳහා රජය විසින් කලින් කලට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට අනුකූලව ආනයන හා අපනයන නියාමනය කිරීම.

1.3 දෙපාර්තමේන්තුවේ වගකීම් හා කාර්යභාරය

i. ආනයන හා අපනයන පාලනයට අදාළ රෙගුලාසි ඇතුළත් අතිවිශේෂ ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කිරීම.

ii. ආනයන හා අපනයන පාලනයට අදාළවන මෙහෙයුම් මාර්ගෝපදේශ, වාණිජ බැංකුවලට, ශ්‍රී ලංකා රේගුවට හා අනෙකුත් ආයතන වෙත නිකුත් කිරීම.

iii. ආනයන හා අපනයන (පාලනය) සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන රෙගුලාසිවලට අදාළවන පරිදි අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම.

iv. ආනයන හා අපනයන පාලන රෙගුලාසිවලට යටත්ව මෙරට ආර්ථිකයේ යහපත උදෙසා බලපත්‍ර නිකුත් කිරීම සහ නියාමනය කිරීම.

v. බලපත්‍ර පාලනයට යටත් කළ අයිතම ආනයනයෙන් පසු හරපත්‍ර නිකුත් කිරීම.

vi. ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි හෝ බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරනු ලබන ආනයනකරුවන් සඳහා අතිරේක ගාස්තු පැනවීම.

vii. උපායමාර්ගික වෙළෙඳ කළමනාකරණ ක්‍රමයක් සහ ප්‍රමිතිකරණය වූ ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමයක් ඇති කිරීම සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.

viii. දේශීය සහ විදේශීය වෙළෙඳාම දියුණු කිරීම සඳහා වන ලෝක වෙළඳ සංගමයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම.

ix. බාසල් සම්මුතිය, මොන්ට්‍රියල් සම්මුතිය ආදී ජාත්‍යන්තර සම්මුතීන්ට අනුගත වීම සඳහා පරිසර අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කිරීම.

x. ජාත්‍යන්තර වාණිජමය ගනුදෙනුවලට අදාළ වන රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම හා නියාමනය කිරීම.

xi. ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සම්බන්ධයෙන් පැන නගින ගැටලු සහගත අවස්ථාවලදී රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත අවශ්‍ය සහාය / උපදෙස් ලබාදීම.

xii. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ හැකියාව, නිපුණත්වය හා ඵලදායිතාවය වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සේවක සුබසාධනය.

xiii. අදාළ රජයේ ගාස්තු එක්රැස් කර, ඒකාබද්ධ අරමුදලට බැර කිරීම.

1.4 සංවිධාන ව්‍යුහය හා සටහන

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානියා වශයෙන් ආනයන හා අපනයන පාලක ජනරාල් කටයුතු කරනු ලබයි.

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත ප්‍රකාරව ක්‍රියාත්මක කරන නීතිරීති, රෙගුලාසි පැනවීම් හා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම් ඇතුළු සමස්ත ආනයන හා අපනයන ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය කර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව පහත සඳහන් අංශ හා ඒකකවලින් සමන්විතව ක්‍රියාත්මක කරනු ලැබේ.

I. ආයතන අංශය
II. ගිණුම් අංශය
III. පර්යේෂණ හා ප්‍රතිපත්ති අංශය
IV. අභ්‍යන්තර විගණන අංශය
V. බලපත්‍ර නිකුත් කිරීමේ අංශ
   - ඒකක 1 - ඖෂධ හා වෛද්‍ය උපකරණ
   - ඒකක 2 - භාවිත කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස්
   - ඒකක 3 - රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය ආනයනය හා අපනයන
   - ඒකක 4 - ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත්
   - ඒකක 5 - සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන
VI. තොරතුරු තාක්ෂණ අංශය

මෙම කර්තව්‍යයන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ තත්‍ය කාර්යමණ්ඩලය පහත සඳහන් සංවිධාන ව්‍යුහය (Organization Chart) යටතේ සේවාලාභීන් වෙත නිරතුරුව සේවය කිරීමට කැපවීමෙන් ක්‍රියාකරනු ලබයි.

2024.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 122 ක් වන අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වා පුරප්පාඩු 14 ක් පැවතියද පවතින කාර්ය මණ්ඩලය මඟින් සේවාලාභීන් වෙත ප්‍රශස්ත සේවයක් ලබා දීමට 2024 වර්ෂයේදී කටයුතු කර ඇත.

කාර්ය මණ්ඩල තොරතුරු ලේඛනය පහතින් දැක්වේ.

2024.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

තනතුර	සේවය/ ශ්‍රේණිය				අනුමත කාර්ය මණ්ඩලය	සත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ මට්ටම								
ආනයන හා අපනයන පාලක ජනරාල්	ශ්‍රී.ලං.ප.සේ	විශේෂ	SL 3	විධායක	01	01	00	
ආනයන හා අපනයන පාලක	ශ්‍රී.ලං.ප.සේ	I	SL 1	විධායක	02	02	00	
ආනයන හා අපනයන පාලක (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)	දීප ව්‍යාප්ත සේවා	I	SL 1	විධායක	01	01	00	
නියෝජ්‍ය/සහකාර පාලක	ශ්‍රී.ලං.ප.සේ	II/III	SL 1	විධායක	06	05	01	
ප්‍රධාන ගණකාධිකාරි	ශ්‍රී.ලං.ග.සේ	I	SL 1	විධායක	01	01	00	
ප්‍රධාන අභ්‍යන්තර විගණක	ශ්‍රී.ලං.ග.සේ	I	SL 1	විධායක	01	01	00	
නීති නිලධාරි	දෙපාර්මේන්තුගත	II/III	SL 1	විධායක	01	00	01	
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)	ශ්‍රී.ලං.තො.තා.සේ	III	SL 1	විධායක	01	01	00	
					14	**12**	**02**	**00**
තෘතීය මට්ටම								
පරිපාලන නිලධාරි	ක.සේ.නි.සේ.	අධි	MN 7	තෘතීයික	01	01	00	
භාෂා පරිවර්තක	භා.ප.සේ.	I/II	MN 6	තෘතීයික	02	02	00	
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි	ශ්‍රී.ලං.තො.තා.සේ	II	MN 6	තෘතීයික	01	01	00	
					04	**04**	**00**	**00**
ද්විතීය මට්ටම								
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	ශ්‍රී.ලං.තො.තා.සේ.	III	MT 1	ද්විතියික	02	03	00	01
දත්ත කළමනාකරණ සහකාර	දෙපාර්මේන්තුගත		MN 4	ද්විතියික	01	01	00	
විමර්ශන සහකාර	දෙපාර්මේන්තුගත		MN 4	ද්විතියික	01	01	00	
සංවර්ධන නිලධාරි	සං.නි.සේ	I/II/III	MN 4	ද්විතියික	23	21	02	
කළමනාකරණ සේවා නිලධාරි	ක.සේ.නි.සේ.	I/II/III	MN 2	ද්විතියික	57	50	07	
					84	**76**	**09**	**01**
ප්‍රාථමික මට්ටම								
රියැදුරු	රියදුරුසේ.	I/II/III	PL 3	ප්‍රාථමික	05	02	03	
කාර්යාල කාර්ය සහායක	කා.සේ.සේ.	I/II/III	PL 1	ප්‍රාථමික	15	15	00	
					20	**17**	**03**	**00**
එකතුව					**122**	**109**	**14**	**1**

සංවිධාන සටහන



නි.පා.	- නියෝජ්‍ය පාලක	දත්ත.ක.ස.	- දත්ත කළමනාකරණ සහකාර
ස.පා.	- සහකාර පාලක	විමර්ෂණ.ස.	- විමර්ශණ සහකාර
සහකාර අධ්‍යක්ෂ.තො.තා.	- සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා තාක්ෂණ)	ස.නි	- සංවර්ධන නිලධාරී
තො.ස.තා.නි	- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	ක.සේ.නි.	- කළමනාකරණ සේවා නිලධාරී
තො.ස.තා.ස	- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	කා.කා.ස.	- කාර්යාල කාර්ය සහායක
ප්‍ර.ක.සේ.නි.	- ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී		

2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 භාණ්ඩ ආනයනය හා අපනයනය නියාමනය සම්බන්ධ ප්‍රතිපත්තිමය නියෝග

පසුගිය වර්ෂයන් තුළ රටේ පැවති ආර්ථික පසුබෑම 2024 වර්ෂයේ දී ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කරනු ලැබීය. විදේශ සංචිතවල ඇතිවූ වැඩිදියුණු වීමත් සමඟින් ආර්ථික කටයුතු සාමාන්‍යකරණය වීමත් සමඟ මෙතෙක් ඉහළ අගයක පැවති ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල යම් ප්‍රමාණයක ශක්තිමත් බවක් දක්නට ලැබුණු අතර එය, ධනාත්මක ආර්ථිකමය ප්‍රතිඵලයක් බව පෙනේ. ඒ අනුව, පසුගිය වකවානුව තුළ පැවති ආනයන සීමා කිරීම් හා විදේශීය වෙළෙඳ ගෙවීම් ක්‍රම සීමා ක්‍රම ක්‍රමයෙන් ලිහිල් කිරීමේ ප්‍රතිපත්තියකට එළඹ ඇත. ඒ අනුව, ආනයනය සීමා පනවා තිබූ අමුද්‍රව්‍ය, අර්ධ නිමිද්‍රව්‍ය හා නිමි ද්‍රව්‍ය (මෝටර් වාහන හැර) සඳහා පනවා තිබූ සියලු ආනයන පාලන සීමා ලිහිල් කිරීම් කටයුතු ද 2024 වර්ෂයේ දී සිදු කරන ලදි.

මහජන සෞඛ්‍ය සහ පරිසරය ආරක්ෂා කිරීම ආශ්‍රිත ගැටලු ඉහළ යෑම සැලකිල්ලට ගනිමින්, කඩිනම්, ආරක්ෂිත සහ ඵලදායී වෙළෙඳ ප්‍රවාහයන්ට පහසුකම් සැලසීමට සහ දේශීය නිෂ්පාදන සහ ආනයනික නිෂ්පාදන සඳහා සාධාරණ සහ සමානාත්මතාවයකින් යුතු පරිසරයක් ඇති කිරීම සම්බන්ධයෙන් පවතින ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන් යාවත්කාලීන කිරීම සහ නව ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන්, 2024 වර්ෂයේ දී හඳුන්වා දීමට කටයුතු කරන ලදි.

තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ ද එකඟතාවය සහිතව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක (HS Codes) 304 ක් යටතේ වර්ගීකරණය වන මෝටර් වාහන සහ අනෙකුත් මෝටර් එන්ජින් භාවිතා නොවන අයිතම ආනයනය කිරීමට අදාළව පනවා තිබූ තාවකාලික ආනයන අත්හිටුවීම අදියර තුනක් (03) යටතේ ඉවත් කිරීමට 2024 සැප්තැම්බර් 13 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, එහි පළමු අදියර යටතේ පොදු ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නා බස් රථ, විශේෂ කාර්යයන් සඳහා යොදා ගන්නා රථ සහ අනෙකුත් මෝටර් එන්ජින් භාවිතා නොවන අයිතම ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම 2024 වර්ෂයේ අවසන් කාර්තුවේ දී සිදු කරන ලදි.

2.1.1 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නව රෙගුලාසි නිකුත් කිරීම

අනු අංකය	අතිවිශේෂ ගැසට් නිවේදන අංකය	දිනය	විස්තරය
1	2366/19	2024.01.11	රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා, තාවකාලිකව අත්හිටුවා ඇති තෝරාගත් මෝටර් රථ වර්ග ආනයනය කිරීම සඳහා අවසර ලබාදීම.
2	2370/15	2024.02.07	2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/78 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) අංක 12 (අ) රෙගුලාසිය සංශෝධනය කිරීම මගින් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා පූර්ණ විදුලි වාහන ආනයනය කිරීමට අවසර දී ඇති කාලය 2024.08.31 දක්වා දීර්ඝ කිරීම.
3	2372/04	2024.02.19	අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති තෝරාගත් කුළුබඩු (උදා: ගම්මිරිස්, සාදික්කා, සහ වසාවාසි, ආදිය) ආනයනය කිරීමට අවසර දීම.
4	2373/28	2024.02.28	පිළිගැනීම් මත ලේඛන (DA) සහ ගෙවීම් මත ලේඛන (DP) ගෙවීම් ක්‍රමවල පූර්ව අනුමත කිරීමේ අවශ්‍යතාවයට අදාළ 2022 අංක 07 දරන ආනයන පාලන රෙගුලාසිවල (2024.05.06 දින අංක 2278/21 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) අංක 6 දරන රෙගුලාසිය ඉවත් කිරීම.
5	2376/14	2024.03.19	රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා, තාවකාලිකව අත්හිටුවන ලද තෝරාගත් මෝටර් රථ ආනයනය කිරීමට අවසර දීම.
6	2379/03	2024.04.08	ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (STC), ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය සඳහා 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති උඳු මෙට්‍රික් ටොන් 2,000ක් ආනයනය කිරීමට අවසර දීම.

අනු අංකය	අතිවිශේෂ ගැසට් නිවේදන අංකය	දිනය	විස්තරය
7	2384/34	2024.05.17	තාවකාලිකව අත්හිටුවන ලද තෝරාගත් මෝටර් රථ සංචාරක අංශය සඳහා ආනයනය කිරීමට අවසර දීම.
8	2384/35	2024.05.17	තෝරාගත් ආනයනයනික භාණ්ඩ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති නියම කිරීම.
9	2387/35	2024.06.06	අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දින අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති පුවක් ආනයනය කිරීමට අවසර දීම.
10	2390/19	2024.06.28	ආහාරයට ගත හැකි තෝරාගත් ධාන්‍ය සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය ඉවත් කිරීම සහ මිනිසුන් රහිත ගුවන් යාත්‍රා සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය පැනවීම.
11	2393/36	2024.07.18	අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති තෝරාගත් කුළුබඩු (උදා: ගම්මිරිස්, සාදික්කා, සහ වසාවාසි, ආදිය) ආනයනය කිරීමට අවසර දීම.
12	2398/18	2024.08.21	2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධානවල අර්ථය තුළ බලයලත් පුද්ගලයන්ට විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ භාණ්ඩ ආනයනය කිරීමට අවසර දීම.
13	2401/21	2024.09.11	අමාත්‍ය මණ්ඩලය විසින් නිසි පරිදි අනුමත කරන ලද ගිවිසුම් සහිතව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන මෝටර් රථ එකලස් කිරීමේ ව්‍යාපෘති සඳහා නවතම අර්ධ වශයෙන් ඒකලස් කළ (SKD) කට්ටල ආනයනය කිරීමට අවසර දීම.
14	2413/37	2024.12.04	2024 දෙසැම්බර් 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1006.30.19 සහ 1006.30.29 යටතේ වර්ගීකරණය කරන ලද සහල් ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL)

අනු අංකය	අතිවිශේෂ ගැසට් නිවේදන අංකය	දිනය	විස්තරය
			අවශ්‍යතාව 2024.12.20 දින දක්වා ඉවත් කිරීම සඳහා අවසර ලබාදීම.
15	2415/35	2024.12.18	අදියර තුනක් යටතේ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක (HS Codes) 304 ක් යටතේ වර්ගීකරණය වන මෝටර් වාහන සහ අනෙකුත් මෝටර් එන්ජින් මත ක්‍රියාත්මක නොවන භාණ්ඩ ආනයනය කිරීම සඳහා වන තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීමේ පළමු අදියර යටතේ පොදු ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නා රථ, විශේෂ කාර්යයන් සඳහා යොදා ගන්නා රථ සහ අනෙකුත් මෝටර් භාවිතා නොවන භාණ්ඩ ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම (HS කේත 52ක්) අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කොන්දේසි වලට යටත්ව ඉවත් කිරීම.
16	2416/11	2024.12.24	2024 දෙසැම්බර් 04 දිනැති අංක 2413/37 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව මෙරටට සහල් ආනයනය කිරීම සඳහා අවසර ලබාදුන් කාල සීමාව 2025 ජනවාරි මස 10 දක්වා දීර්ඝ කිරීම.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක **2366/19 - 2024.01.11**

2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/78 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි ප්‍රකාරව ආනයනය තාවකාලිකව තහනම් කර ඇති, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 8702.10.75 යටතේ වර්ගීකරණය කරන ලද පිරිමැසුම් පන්තියේ ඊම්ප් රථ තුනක් (03) ශ්‍රී ලංකා ගුවන් සමාගමේ භාවිතය සඳහා ආනයනය කිරීමට, එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල මගින් පරිත්‍යාග කරන ලද ජංගම මාතෘ ඒකක 03 ක් ආනයනය කිරීමට, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මගින් සපයනු ලබන ද්විත්ව කැබ් රථ 21 ක් ලබා ගැනීමට, රැකියා බලපත්‍ර ක්‍රමය ස්ථාපිත කිරීමේදී ශ්‍රී ලංකාව සහ කොරියානු ජනරජය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම යටතේ සපයන ලද මෝටර් රථයක්, කොරියානු අරමුදල් ව්‍යාපෘතියේ භාවිතයට ලබා ගැනීමට සහ ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව එක්ව අරමුදල් සපයන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා බස් රථ ඒකක 02ක් ලබා ගැනීම සඳහා ලද 2023 දෙසැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා 2024 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක **2370/15 – 2024.02.07.**

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු වෙත විධිමත් බැංකු මාර්ගයෙන් අවම විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක් හුවමාරු කිරීම මත විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයෙකුට විද්‍යුත් මෝටර් වාහන ආනයනය කිරීමට අවසර ලබා දීම සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයාගේ 2022 ජූලි මස 23 දිනැති අංක 22/1028/625/001 දරන සංදේශයට 2022 අගෝස්තු මස 08 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

ඒ අනුව, 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි වල 12 (අ) රෙගුලාසියට අනුව, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ අංක 02/2022 චක්‍රලේඛය ප්‍රකාරව වලංගු "වාහන ආනයන බලපත්‍රයක්" ලබා ගත් සංක්‍රමණික සේවකයින්ට 2023 දෙසැම්බර් 31 දක්වා පූර්ණ විදුලි වාහන ආනයනය කිරීමට අවසර ලබා දී ඇත.

යෝජනා ක්‍රමයේ වලංගු කාලය අවසන් වීම මත, ඉහත සඳහන් කළ පරිදි "වාහන ආනයන බලපත්‍රය" ලබාගෙන ඇති සංක්‍රමණික සේවකයින් විසින් මෝටර් වාහන ආනයනය කිරීම සඳහා ණයවර ලිපි (LC) පිහිටුවීමේ කාලසීමාව 2024 ජූනි 30 දක්වා දීර්ඝ කිරීම ඇතුළත් කරමින් "එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමය" යන මැයෙන් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ 2023 දෙසැම්බර් 22 දිනැති අංක 23/2522/625/018-III දරන සංදේශයේ දක්වා ඇති යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2024 ජනවාරි 08 වැනි දින අනුමැතිය ලබා දෙන ලද අතර ඒ අනුව, 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 12 (අ) රෙගුලාසියෙහි නිශ්චිතව දක්වා ඇති කාලය 2024 අගෝස්තු 31 දක්වා දීර්ඝ කරමින් 2024 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2372/04 - 2024.02.19

2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මගින් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන, 2020 අගෝස්තු මස 17 දිනැති අංක 2189/4 ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2020 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් ගම්මිරිස්, සියඹලා, කුරුඳු, කරාබු නැටි, සාදික්කා, වසාවාසි, එනසාල්, ඉඟුරු සහ කහ යන කුළුබඩු සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවා ඇත.

සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු සඳහා "අනුමත ව්‍යවසාය" නාමය ලබාගෙන ඇති ව්‍යවසායන් විසින්, සංයෝජිත වර්ගීකරණ සංකේතයන් 10ක් යටතේ වර්ගීකරණය කර ඇති ගම්මිරිස්, සාදික්කා, එනසාල්, ඉඟුරු සහ කහ ආනයනය කිරීම සඳහා අවසර ලබාදීම ඇතුළුව, "තෝරාගත් කුළුබඩු ආනයනය හා සැකසුම සහ තෙල් නිස්සාරණ, ඔලියොරෙසින් හා අවශේෂ ස්වරූපයෙන් ප්‍රතිඅපනයනය කිරීමේ ක්‍රියාපටිපාටිය සඳහා අනුමැතිය" යන මැයෙන් යුත් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයාගේ 2023 දෙසැම්බර් මස 06 දිනැති අංක 23/2380/631/032 දරන සංදේශය සඳහා, 2023 දෙසැම්බර් මස 18 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී . ඒ අනුව, ඉහත සඳහන් 2023 දෙසැම්බර් 06 දිනැති අංක 23/2380/631/032 දරන සංදේශයේ දක්වා ඇති යෝජනා සඳහා ලද අමාත්‍ය මණ්ඩලයේ තීරණය බලාත්මක කරමින් 2024 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2373/28 -2024.02.28

නෛතික නොවන විදේශ විනිමය වෙළෙඳපොළ මෙහෙයුම් පුළුල් වීම මැඩලීම සහ රේගු නිෂ්කාශනයේ දී ආනයන සඳහා වටිනාකම අඩු ඉන්වොයිසි ඉදිරිපත් කිරීම වැළැක්වීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යෝජනා කරන ලද පරිදි තෝරාගත් ගෙවීම් නියමවල යෙදවුම්, එනම් විවෘත ගිණුම් ගෙවීම් ක්‍රම, භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම, ගෙවීම් මත ලේඛන සහ පිළිගැනීම් මත ලේඛන ගෙවීම් ක්‍රම, 2022 මැයි මස 06 දිනැති අංක 2278/21 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි මගින් සීමා කරන ලදී. එකී 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසිවල අංක 6 රෙගුලාසිය අනුව, අදාළ බලපත්‍රලාභී බැංකුව මගින් නාමමාත්‍ර ඉන්වොයිසියට, නෞභාර පත්‍රයේ / ගුවන් භාර පත්‍රයේ නැව්/ගුවන් ගත කළ දිනයට පෙර ලබාගත

යුතු පූර්ව පිටසන් කිරීමේ අවශ්‍යතාවයක් සහිතව ගෙවීම් මත ලේඛන සහ පිළිගැනීම් මත ලේඛන ගෙවීම් ක්‍රම විධිමත් කර ඇත.

කෙසේ වෙතත්, වාණිජ බැංකු කිහිපයක් සහ ආනයනකරුවන් විසින් ඔවුන්ගේ බලපත්‍රලාභී බැංකුවල ප්‍රමාණවත් විදේශ මුදල් ඇති බැවින් ඉහත සඳහන් කළ පූර්ව පිටසන් කිරීමේ අවශ්‍යතාවය ඉවත් කරන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව, 'ගෙවීම් මත ලේඛන සහ පිළිගැනීම් මත ලේඛන ගෙවීම් ක්‍රම' ක්‍රියාත්මක කිරීම සඳහා සඳහා පූර්ව පිටසන් කිරීමේ අවශ්‍යතාවය අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ උපදේශන/ සාකච්ඡා කිරීමෙන් පසුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ මෑතකාලීන වර්ධනයන් සැලකිල්ලට ගනිමින් එකී ගෙවීම් ක්‍රමවල එලෙස පූර්ව පිටසන් කිරීමේ අවශ්‍යතාවය අවලංගු කිරීමට තීරණය කරන ලදී.

ඒ අනුව, 2024 පෙබරවාරි මස 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි, 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසිවල අංක 6 රෙගුලාසිය ඉවත් කරමින්, 2024 අංක 04 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි පනවන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක **2376/14 – 2024.03.19**

2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/78 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි ප්‍රකාරව ආනයනය තාවකාලිකව අත්හිටුවීමට යටත් වන ඉවතලන කසළ හැකිළිය හැකි අපහරණ රථයක් ඇතුළුව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි හා කොළඹ වරායෙහි දේශ සීමා මායිම් හරහා අදාළ වන සෞඛ්‍ය ධාරිතාවන් වැඩිදියුණු කිරීම සඳහා උපකරණ / භාණ්ඩ ආනයනය කිරීමට, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් 2024 පෙබරවාරි මස 07 දිනැති සිය අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 24/0309/628/018 මඟින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා සිටින ලද අතර, යෝජිත ආනයනවල හදිසි අවශ්‍යතාවය සහ අරමුණ සලකා බලා, ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල සංදේශයේ විස්තර කර ඇති මෝටර් වාහන සහ එම සංදේශයට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් 2024 පෙබරවාරි 26 වැනි දින ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ වල සඳහන් කර ඇති යම් වාහන ආනයනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් ඔවුන්ගේ 2024 පෙබරවාරි මස 26 දිනැති තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත.

තවද, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ ඉහත කී නිරීක්ෂණ වල සඳහන් පරිදි රජයේ සංවිධාන හෝ රජයේ ව්‍යාපෘති මගින්, පරිත්‍යාග ලෙස / අරමුදල් සපයන ව්‍යාපෘති ගිවිසුම්වල විධිවිධාන අනුව මෝටර් වාහන ආනයනය සඳහා සහ රජයේ හෝ පෞද්ගලික රෝහල්වල සෘජු භාවිතය සඳහා "විදේශ විනිමය වැය නොවන (NFE)" පදනම මත අලුත් / භාවිත කරන ලද ගිලන්රථ ආනයනය කිරීම සඳහා අවසර ලබාදීමට භාණ්ඩාගාර ලේකම්වරයා වෙත බලය පැවරීමට ද අමාත්‍ය මණ්ඩලය විසින් ඉහත සඳහන් තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, ඉහත කී අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කරමින්, 2024 අංක 05 දරන ආනයන හා අපනයන පාලන රෙගුලාසි පනවන ලදි.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක **2379/03 -2024.04.08**

2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මගින් සංයෝජිත වර්ගීකරණ සංකේත 0713.31.22 සහ

0713.31.29 යටතේ වර්ගීකරණය කරන ලද උඳු, ආනයනය කිරීම සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවා ඇත. කෙසේවෙතත්, ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (STC), ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සඳහා උඳු, මුළු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 2,000ක් ආනයනය කිරීමට අවසර දීම ඇතුළුව, 2024 අප්‍රේල් මස 01 දිනැති මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සමඟ එක්ව කියවිය යුතු, 'උඳු ආනයනය කිරීම සඳහා අවසර ලබා ගැනීම' යන මැයෙන් කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2024 මාර්තු මස 25 දිනැති අංක 24/0614/612/034 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් යෝජනා සඳහා 2024 අප්‍රේල් මස 01 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

ඒ අනුව, උක්ත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ඉහත සඳහන් ආයතන සඳහා ආනයන පාලන බලපත්‍රයකට යටත්ව උඳු ආනයනය කිරීමට අවසර ලබා දෙමින්, 2024 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2384/34 -2024.05.17

2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/78 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි ප්‍රකාරව ශ්‍රී ලංකාවට මෝටර් වාහන ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත. සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් සිය 2024 අප්‍රේල් මස 01 දිනැති අංක 24/0644/615/003-I දරන සංදේශය මගින් "සංචාරක අංශයේ වේගවත් සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම" යන මැයෙන් සංචාරකයින් ප්‍රවාහනයේ සෘජු භාවිතය සඳහා පමණක් කුඩා ප්‍රමාණයේ බස් රථ හා බස් රථ 250ක් සහ වෑන් රථ 750ක් (ආසන 6 - 15) ඇතුළුව නවතම මෝටර් රථ 1,000ක් ආනයනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටින ලදී. එම යෝජනාව මත පදනම්ව 2024 අප්‍රේල් මස 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා, 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2384/35 -2024.05.17

ජාතික ආර්ථිකය, මහජන සෞඛ්‍යය සහ පරිසරය සුරක්ෂිත කිරීමේ අරමුණින්, තෝරාගත් භාණ්ඩ වර්ග ආනයනය කිරීමේදී ප්‍රමිති සහ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා 2017 ආනයන හා අපනයන පාලන (ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන) රෙගුලාසි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන(පාලන) පනත යටතේ පනවා 2018 මාර්තු මස 29 දිනැති අංක 2064/34 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී.

තාක්‍ෂණයේ දියුණුව, නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම, තත්ත්ව වැඩිදියුණු කිරීම්, මහජන සෞඛ්‍ය සහ පරිසරය ආරක්ෂා කිරීම ආශ්‍රිත ගැටලු ඉහළ යෑම සැලකිල්ලට ගනිමින්, කඩිනම්, ආරක්ෂිත සහ ඵලදායී වෙළඳ ප්‍රවාහයන්ට පහසුකම් සැලසීමට සහ දේශීය නිෂ්පාදන සහ ආනයනික නිෂ්පාදන සඳහා සාධාරණ සහ සමානාත්මතාවයකින් යුතු පරිසරයක් ඇති කිරීම සම්බන්ධයෙන් පවතින ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන් යාවත්කාලීන කිරීම සහ නව ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන් හඳුන්වා දීමේ අවශ්‍යතාවය අනුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් රාජ්‍ය ආයතන, ව්‍යාපාරික සංගම්, සහ වාණිජ මණ්ඩල ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර, පවතින ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන් (2017 ආනයන හා අපනයන පාලන (ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන) රෙගුලාසිවල නිශ්චිතව දක්වා ඇති) සංශෝධනය කරමින් යාවත්කාලීන කර ඇති අතර නැගී එන නිෂ්පාදන තාක්ෂණය, පරිභෝජන රටා සහ වෙළඳ ප්‍රවාහයට මුහුණ දීම සඳහා නව ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන් ස්ථාපිත කරන ලදී.

මේ අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් 2024 පෙබරවාරි මස 28 දිනැති අංක 24/0466/604/056 දරන සංදේශය මගින් යෝජනා කර ඇති පරිදි, යාවත්කාලීන කරන ලද ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන් ක්‍රියාත්මක කිරීම සඳහා වන රෙගුලාසි පැනවීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2024 මාර්තු මස11 දින අනුමැතිය ලබා දෙන ලද අතර, ඒ අනුව, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන රෙගුලාසි පනවන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2387/35 -2024.06.06

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් "අගය එකතු කිරීම සහ ප්‍රතිඅපනයන අරමුණ සඳහා පුවක් ආනයනය කිරීම" යන මැයෙන් ඉදිරිපත් කළ 2024 මැයි 22 දිනැති අංක 24/0983/631/019-I දරන සංදේශය සම්බන්ධයෙන් වන 2024 මැයි 22 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව, ආනයන පාලන බලපත්‍රයක් ලබා ගැනීමට යටත්ව සැකසුම් සහ ප්‍රතිඅපනයන අරමුණු සඳහා "අනුමත ව්‍යවසායන්" විසින් පුවක් (වියලි, ලෙලි ගසන ලද, කරුංකා කරන ලද) ආනයනය කිරීමට හැකිවන පරිදි ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

ඒ අනුව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයාගේ අංක 23/0585/631/008-I දරන සංදේශය මත 2023 මාර්තු 27 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය මගින් අනුමත කරන ලද පරිදි, "ක්‍රියාපටිපාටිය: ප්‍රතිඅපනයන අරමුණු සඳහා පුවක් සැකසුම් කර්මාන්තය" අනුව ප්‍රකාශිත අනුමත ව්‍යවසායයක් විසින්, දේශීය වෙළෙඳපොළ තුළ වෙනත් කිසිදු ආකාරයක ඍජු හෝ වක්‍ර විකුණුම් අරමුණු සඳහා නොවන, සංයෝජිත වර්ගීකරණ සංකේතාංකයේ ඉලක්කම් හතරක (04) මට්ටමේ පරිවර්තනය සමග දේශීයව එකතු කළ අගය අවම වශයෙන් 35% ක් සහිතව සහ එම ක්‍රියා පටිපාටියේ අනෙකුත් නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, සැකසීම සහ ප්‍රති-අපනයනය කිරීමේ අරමුණ සඳහා, 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල V උපලේඛනයේ ලැයිස්තුගත කර ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0802.80.90 - වෙනත් (වියළි, පොතු ගැලවූ සහ තාප පිරියම් කරන ලද) යටතේ වර්ග කර ඇති පුවක් ආනයනය සඳහා 2024 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2390/19 – 2024.06.28

මුං ඇට (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0713.31.19), උඳු (සංයෝජිත වර්ගීකරණ සංක්තාංක 0713.31.22 සහ 0713.31.29), කව්පි (සංයෝජිත වර්ගීකරණ සංක්තාංක 0713.35.90), කුරක්කන් (සංයෝජිත වර්ගීකරණ සංක්තාංක 1008.29.10), රට කජු (සංයෝජිත වර්ගීකරණ සංක්තාංක 1202.30, 1202.41 සහ 1202.42), සහ සෝයා පිටි (සංයෝජිත වර්ගීකරණ සංක්තාංක 1208.10) ආනයනය කිරීම සඳහා වූ ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාව ඉවත් කිරීම සඳහා, එවැනි සෑම භාණ්ඩ තොගයකම නෞභාර පත්‍රය හෝ ගුවන්භාර පත්‍රයේ දිනයට පූර්වයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික ශාක නිරෝධායන සේවය මගින් නිකුත් කල ජාතික ශාක නිරෝධායන බලපත්‍රය ඉදිරිපත් කිරීමට යටත්ව මෙම ආනයනික ආහාරයට ගනු ලබන ධාන්‍ය තොග නිදහස් කිරීමට ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියෝග කරමින්, "ආහාරයට ගනු ලබන තෝරාගත් ධාන්‍ය වර්ග ආනයනය කිරීම සඳහා වන ආනයන පාලන බලපත්‍රයක අවශ්‍යතාවය ඉවත් කිරීම" යන මැයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ 2024 මැයි මස 13 දිනැති අංක 24/0939/604/104 දරන සංදේශය සඳහා ලබා දුන් තම 2024 ජූනි 03 දිනැති තීරණය මගින් අමාත්‍ය මණ්ඩලය අනුමැතිය දී ඇත.

මීට අමතරව, ශ්‍රී ලංකා රේගුව විසින් ආරක්ෂක අමාත්‍යාංශයට සහ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට කරන ලද ඉල්ලීම මත පදනම්ව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ

යෝජනාව ප්‍රකාරව, නියාමනය නොකළ ආනයන හේතුවෙන් ජාතික ආරක්ෂාවට ඇති වන ගැටළු වලට පිළියම් ලෙස සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 88.06හි සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 11ක් යටතේ වර්ගීකරණය කරන ලද මිනිසුන් රහිත ගුවන් යානා (ඩ්‍රෝන යානා) ඉහත සඳහන් කළ 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල I වන උපලේඛනයට ඇතුළත් කිරීමට ද තීරණය කරන ලදී. එම තීරණ බලාත්මක කරමින් 2024 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2393/36 -2024.07.18

"අනුමත ව්‍යවසාය" නාමය ලබාගෙන ඇති ව්‍යවසායන් විසින්, සංයෝජිත වර්ගීකරණ සංක්තාංක 10ක් යටතේ වර්ගීකරණය කර ඇති ගම්මිරිස්, සාදික්කා, එනසාල්, ඉඟුරු සහ කහ ආනයනය කිරීම සඳහා අවසර ලබාදීම සඳහා 2023 දෙසැම්බර් මස 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පනවන ලද 2024 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල, රෙගුලාසි අංක 4 සහ 6 සංශෝධනය කිරීමට යටත්ව එම රෙගුලාසි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නව රෙගුලාසියක් පැනවීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2024 ජූනි 11 දිනැතිව අනුමැතිය ලබා දෙන ලදී. එම අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කරමින් 2024 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවන ලදි.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2398/18 - 2024.08.21

රටෙහි විදේශ විනිමය සංචිත ශක්තිමත් කිරීම, වඩාත් ආරක්ෂිත සහ සත්‍යාපිත ගෙවීම් ක්‍රම සහතික කිරීම සහ අනාරක්ෂිත ණය ගනුදෙනු හා සම්බන්ධ අවදානම අඩු කිරීමේ අරමුණින් 2022 මැයි 06 දිනැති අංක 2278/21 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි මගින් විවෘත ගිණුම් ක්‍රමය යටතේ භාණ්ඩ ආනයනය කිරීම සීමා කර ඇත.

කෙසේ වෙතත්, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සෘජු විදේශ ආයෝජන ගලා එනු ලබන ක්‍රමෝපායික වැදගත්කමක් ඇති ව්‍යාපාරවල අපේක්ෂිත ආර්ථික හා සමාජීය දායකත්වය සලකා බැලීමෙන් පසුව, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධානවල අර්ථය තුළ "ක්‍රමෝපායික වැදගත්කමක් ඇති ව්‍යාපාරයක්" ලෙස ද නම් කර ඇති බලයලත් තැනැත්තෙකු විසින් 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට එවැනි බලයලත් තැනැත්තෙකුගේ අනුමත ඕනෑම ක්‍රියාකාරකමක් සිදු කිරීම සඳහා, ප්‍රාග්ධන/ ව්‍යාපෘති ආශ්‍රිත භාණ්ඩ ඇතුළු භාණ්ඩ, එම භාණ්ඩ බලයලත් තැනැත්තාගේ නමට පවරනු ලැබ ඇත්තේ නම් පමණක්, ශ්‍රී ලංකාවේ ඕනෑම වරායකට/ ගුවන්තොටුපළකට පැමිණීමට පෙර ලබාගෙන ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශය මත, විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ ආනයනය සහ රේගු නිෂ්කාශනය සඳහා ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අවසර ලබාදීම සඳහා 2024 අංක 11 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි පනවන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2401/21 - 2024.09.11

සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 87 පරිච්ඡේදය යටතේ වර්ගීකරණය කරන ලද මෝටර් වාහන ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවීම නොවෙනස්ව පවතින අතර 2023 ජනවාරි 01 දිනැති අංක 2312/78 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් අඛණ්ඩව බලාත්මක වේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන, අමාත්‍ය

මණ්ඩලය විසින් නිසි ලෙස අනුමත කරන ලද ගිවිසුම් සහිත මෝටර් රථ එකලස් කිරීමේ ව්‍යාපෘති සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 87.02, 87.03 සහ 87.04 යටතේ වර්ගීකරණය කර ඇති නවතම අර්ධ වශයෙන් කොටස්වලට ගලවන ලද (SKD) කට්ටල ආනයනය කිරීමට අවසර ලබා දීමට, 2024 අගෝස්තු 26 දිනැති අංක 24/1706/601/102 දරන සංදේශය සඳහා වන 2024 අගෝස්තු 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත.

එකී අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) යටතේ ස්ථාපිත කර ක්‍රියාත්මක වන ව්‍යවසායයකට, එම ව්‍යවසාය සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර ඇතිකරගත් සහ අමාත්‍ය මණ්ඩලය විසින් නිසි ලෙස අනුමත කරන ලද ගිවිසුමේ විධිවිධාන අනුව තම මෝටර් වාහන එකලස් කිරීමේ පහසුකම තුළ මෝටර් රථ එකලස් කිරීම සඳහා, 87.02, 87.03 සහ 87.04 යන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂයන් යටතේ වර්ගීකරණය කර ඇති, ලියාපදිංචි නොකළ (නවීන) අර්ධ වශයෙන් කොටස් වලට ගලවන ලද (SKD) කට්ටල ආනයනය සහ රේගු නිෂ්කාශනය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අයත් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් අවසර දීම සඳහා, 2024 අංක 12 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවන ලදි.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක **2413/37 – 2024.12.04**

2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි අනුව, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1006.30.19 සහ 1006.30.29 යටතේ වර්ග කරන ලද සහල් ආනයනය සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවා ඇත. නමුත් දේශීය වෙළෙඳපලේ පවතින නාඩු සහල් සහ අනෙකුත් සහල් වර්ගවල හිඟය මෙන්ම පසුගිය දිනවල පැවැති අධික වර්ෂාපතනය හේතුවෙන් වී වගාවට සිදුවී ඇති දැඩි හානිය සැලකිල්ලට ගනිමින් ප්‍රමාණවත් සහල් තොග දේශීය වෙළෙඳපලට සැපයෙන බව තහවුරු කර ගැනීම පිණිස සහල් ආනයනය කිරීම සඳහා දැනට පනවනු ලැබ ඇති සීමාවන් තාවකාලිකව ඉවත් කිරීමේ යෝග්‍යතාව පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන ලදුව, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා සහ කම්කරු අමාත්‍යතුමා ඉදිරිපත් කල අංක 24/2067/817/001 දරන ඒකාබද්ධ සංදේශය පිළිබඳව වූ 2024 නොවැම්බර් 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව 2024 දෙසැම්බර් 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව 2024 දෙසැම්බර් 20 දින දක්වා මෙරටට සහල් ආනයනය කිරීමට අවසර ලබා දී ඇත. ඒ අනුව, 2024 දෙසැම්බර් 02 වැනි දින හෝ ඊට පසුව ශ්‍රී ලංකාවේ වරාය/ගුවන්තොටුපළ වෙත පැමිණීම සහ වෙනත් ලේඛන සමග රේගු සටහන්කරය (රේගු ප්‍රකාශය) 2024 දෙසැම්බර් 04 සිට 2024 දෙසැම්බර් 20 දක්වා කාලය තුළ රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත භාර දියයුතු වීම යන කොන්දේසි මත සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1006.30.19 සහ 1006.30.29 යටතේ වර්ගීකරණය කරන ලද සහල් ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාව 2024 දෙසැම්බර් 20 දින දක්වා ඉවත් කිරීම සඳහා 2024 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවන ලදී.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක **2415/35 – 2024.12.18**

2020 මැයි මස 22 දිනැති අංක 2176/19 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි මගින්, තෝරාගත් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ වර්ගීකරණය කරන ලද වාහන ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවන ලදී. එකී තාවකාලික ආනයන අත්හිටුවීම, 2023 ජනවාරි මස 01 දිනැති අංක

2312/78 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි ප්‍රකාරව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 304ක් යටතේ අඛණ්ඩව බල පැවැත්විණි.

මෙවැනි පසුබිමක් තුළ, 2024 සැප්තැම්බර් මස 12 දිනැති අංක 24/1945/604/208 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මත පදනම්ව, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 304 අතුරින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 273ක් යටතේ වර්ගීකරණය කර ඇති (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 31ක් යටතේ වර්ගීකරණය කර ඇති ත්‍රීරෝද රථ සහ අනුමත කාලසීමාව ඉක්ම වූ මෝටර් වාහන හැර) මෝටර් වාහන ආනයනය සඳහා පනවා ඇති තාවකාලික අත්හිටුවීම පහත සඳහන් පරිදි අදියර තුනකින් ඉවත් කිරීමට, 2024 සැප්තැම්බර් මස 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ එකඟතාවය සහිතව, I වන අදියර යටතේ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 52ක් යටතේ වර්ගීකරණය වන පොදු ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නා බස් රථ, විශේෂ කාර්යයන් සඳහා යොදා ගන්නා රථ සහ අනෙකුත් මෝටර් එන්ජින් භාවිතා නොවන රෝද සහිත අයිතම ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කරමින්, 2024 අංක 14 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවන ලදි.

අතිවිශේෂ ගැසට් නිවේදන අංක **2416/11 – 2024.12.24**

2024 දෙසැම්බර් 04 දිනැති අංක 2413/37 දරන ගැසට් පත්‍රය මඟින් ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව 2024 දෙසැම්බර් මස 04 දින සිට 2024 දෙසැම්බර් මස 20 දින දක්වා මෙරටට සහල් ආනයනය කිරීමට අවසර ලබා දෙන ලද අතර එම කාල සීමාව 2025 ජනවාරි මස 10 දක්වා දීර්ඝ කිරීම සඳහා "සහල් ආනයනය /ප්‍රසම්පාදනය සඳහා අනුමැතිය" මැයෙන් වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කල අංක 24/2256/817/001-II දරන සංදේශය සඳහා 2024 දෙසැම්බර් මස 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව සහල් ආනයනය සඳහා ලබා දුන් අවසරය 2025 ජනවාරි මස 10 දක්වා දීර්ඝ කිරීමට අවසර ලබා දීම සඳහා 2024 අංක 15 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවන ලදී.

2.1.2 මෙහෙයුම් උපදෙස් හා අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම

දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ ප්‍රකාශිත ගැසට් නිවේදනයන්හි ඇතුළත් රෙගුලාසි පිළිබඳව ශ්‍රී ලංකා රේගුව, වාණිජ බැංකු හා දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුම්වත් කිරීම ඉතා වැදගත් වේ. එබැවින්, ගැසට්පත්‍රයක් ප්‍රකාශයට පත්කරන සෑමවිටම අදාළ පාර්ශ්වයන්ගේ දැනුම්වත්භාවය උදෙසා මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම හා අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමකි. ඒ අනුව, 2024 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් උපදෙස් 16 ක් හා අභ්‍යන්තර චක්‍රලේඛ 19 ක් නිකුත් කිරීමට පියවර ගෙන ඇත.

2.2. ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම

ආනයන හා අපනයන කටයුතු නියාමනය කරනු ලබන ආයතනයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් ආනයන හා අපනයන පාලනයට යටත් කරන ලද අයිතම සඳහා බලපත්‍ර නිකුත් කිරීම ප්‍රධාන කාර්යයක් වේ. ඒ අනුව, එකී කාර්යය විධිමත්ව හා ඵලදායිව සිදු කරමින් සේවාලාභීන් වෙත ගුණාත්මක

සේවාවක් ලබා දීමට මෙම දෙපාර්තමේන්තුවේ ඒකක 5 ක් ස්ථාපිතකර ඇති අතර, එම ඒකකයන් මගින් බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි.

ඒ අනුව 2024 වර්ෂයේදී එක් එක් ඒකකයන් විසින් නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

2.2.1. ඒකකය 01 - ඖෂධ සහ වෛද්‍ය උපකරණ

ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම සඳහා ඖෂධ සහ වෛද්‍ය උපකරණ ප්‍රධාන කාණ්ඩ පහකට වර්ග කර ඇති අතර, එක් එක් කාණ්ඩය යටතේ 2024 වර්ෂයේදී නිකුත් කරන බලපත්‍ර සංඛ්‍යාව පහත පරිදි වේ.

අංකය	විස්තරය	කාණ්ඩය	බලපත්‍ර සංඛ්‍යාව
1	බටහිර ඖෂධ	400	914
2	පශු ඖෂධ	410	404
3	ආයුර්වේද ඖෂධ	420	175
4	හෝමියෝපති ඖෂධ	430	10
5	වෛද්‍ය උපකරණ	450	80
	එකතුව		**1,583**

ඖෂධ සහ වෛද්‍ය උපකරණ සඳහා නිකුත් කර ඇති බලපත්‍ර



2.2.2 ඒකක 2 - භාවිත කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස්

මෙම ඒකකය මඟින් භාවිත කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් හා වෙනත් අයිතම කිහිපයක් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදුකරනු ලබන අතර 2024 වර්ෂයට අදාළව පහත පරිදි බලපත්‍ර නිකුත් කර ඇත.

	විස්තරය	කාණ්ඩය	බලපත්‍ර සංඛ්‍යාව
1	විදේශගත ශ්‍රමිකයන් විසින් සිදුකරන පරිත්‍යාග	110	06
2	සමාජ සේවා ආයතන සඳහා පරිත්‍යාග	150	09
3	විශේෂ කාර්ය වාහන	180	01
4	කෘෂිකාර්මික අංශය සඳහා වන පාවිච්චි කළ ට්‍රැක්ටර්	190	01
5	ගුවන් යානා සහ හෙලිකොප්ටර් අමතර කොටස්	210	187
6	එන්ජින්	220	02
7	යන්ත්‍ර සහ උපාංග	225	02
8	බොඩි ෂෙල්	230	38
9	භාවිත කළ මෝටර් බයිසිකල්	240	02
10	ඉලෙක්ට්‍රික් මෝටර් බයිසිකල්	242	154
11	බයිසිකල්	244	13
12	හෙල්මට්	245	30
13	වැසි	290	168
14	ආසන (භාවිත කළ වාහන ආසන)	320	03
15	භාවිත කළ ඇඳුම්	720	24
එකතුව			640

.

භාවිත කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් සඳහා නිකුත් කළ බලපත්‍ර



2.2.3 ඒකක 3 - රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක , කාර්මික අමුද්‍රව්‍ය ආනයනය හා අපනයන

ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය සහ අපනයන අයිතමයන් සඳහා 2024 වර්ෂය තුළ නිකුත් කරන ලද බලපත්‍ර පිළිබඳ විස්තර පහත පරිදි වේ.

	විස්තරය	කාණ්ඩය	බලපත්‍ර සංඛ්‍යාව
1	පූර්වජ රසායනික ද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය	500	508
2	ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන	510	1452
3	කෘෂි රසායනික හැර අනෙකුත් රසායනික ද්‍රව්‍ය, කෘමිනාශක	520	1940
4	විකිරණශීලී ද්‍රව්‍ය	530	182
5	මද්‍යසාර	540	229
6	ලෝහ, ලෝහ සුන්බුන් අපනයන	710	317
7	ලෝහ, ලෝහ සුන්බුන් ආනයන	715	153
8	ප්ලාස්ටික් ආහාර බඳුන්	730	01
9	කාබනික අපද්‍රව්‍ය	735	99
එකතුව			4,881

රසායනික ද්‍රව්‍ය, පොහොර, පලිබෝධනාශක , කාර්මික අමුද්‍රව්‍ය ආනයනය, අපනයන සඳහා නිකුත් කරන ලද බලපත්‍ර



2.2.4 ඒකක 4 -ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත්

2024 වර්ෂයේදී ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත් ආනයන සහ අපනයන සඳහා පහත පරිදි ආනයන බලපත්‍ර නිකුත් කර ඇත.

	විස්තරය	කාණ්ඩය	බලපත්‍ර සංඛ්‍යාව
1	පුපුරණ ද්‍රව්‍ය සහ ගිනි අවි	600	207
2	ඉරන ලද ලී හා ලී කුට්ටි	602	108
3	ජංගම දුරකථන (පාවිච්චි කළ / අලුත්)	615	3770
4	සන්නිවේදන උපකරණ	620	1205
5	පරිගණක	625	04
6	තාප පොම්ප	631	16
7	ශීතකාරක වායු	640	99

8	වායු සමීකරණ යන්ත්‍ර	645	167
9	තැටි මඟින් ක්‍රියාත්මක ක්‍රීඩා භාණ්ඩ කට්ටල සහ කාසි දැමීම මඟින් ක්‍රියාත්මක ක්‍රීඩා උපකරණ	650	07
10	විදුලි පේනු සහ කෙවිනි	655	79
11	දුරස්ථ පාලකයකින් ක්‍රියා කරන සෙල්ලම් බඩු	660	91
12	සිගරට් පේපර්	670	69
13	භාවිත කරන ලද ගෘහ භාණ්ඩ	680	01
14	කියත් (සර්කියුලර් සෝ/ජිට්සෝ)	685	102
15	මුද්‍රණ යන්ත්‍ර	690	210
16	කාළගුණ බැලූන්	695	01
	එකතුව		**6,136**

ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත් ආනයන සහ අපනයන සඳහා නිකුත් කළ බලපත්‍ර



2.2.5 ඒකක 5- සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන

සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන සඳහා පහත පරිදි බලපත්‍ර නිකුත් කර ඇත.

	විස්තරය	කාණ්ඩය	බලපත්‍ර සංඛ්‍යාව
1	සතුන් සහ සත්ත්ව නිෂ්පාදන	550	2222
2	ලූණු	505	27
3	සීනි	515	17
4	ශීත කළ මසුන්	555	278
5	ශීතකළ දැල්ලන්	556	2
6	ලෙලි කජු	560	36
7	ධාන්‍ය වර්ග	570	174
8	සහල්	572	173
9	ශක්තිජනක පාන	575	55
10	තේ කොළ	580	687
11	පාම් ඔලේන් හා පාම් ස්ටියරීන්	750	61
12	රත්‍රං	760	37
13	රෙදි	725	1
	එකතුව		3,770

සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන සඳහා නිකුත් කළ බලපත්‍ර



2.2.6 2024 වර්ෂයේ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර - මාසිකව

මාසය	ඒකක 1	ඒකක 2	ඒකක 3	ඒකක 4	ඒකක 5	එකතුව
ජනවාරි	164	44	484	776	445	1913
පෙබරවාරි	136	31	453	561	245	1426
මාර්තු	103	48	436	376	228	1191
අප්‍රේල්	131	28	388	287	249	1083
මැයි	119	62	373	337	299	1190
ජූනි	114	42	349	411	253	1169
ජූලි	132	58	492	532	367	1581
අගෝස්තු	123	58	403	614	397	1595
සැප්තැම්බර්	125	74	318	535	231	1283
ඔක්තෝබර්	141	52	398	564	408	1563
නොවැම්බර්	145	92	415	575	332	1559
දෙසැම්බර්	150	51	372	568	316	1457
එකතුව	1,583	640	4,881	6,136	3,770	17,010



2.2.7 පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද ආනයන අපනයන පාලන බලපත්‍ර

	අයිතමය	2020	2021	2022	2023	2024
ඒකක 01	ඖෂධ	2,594	2,255	1,832	1,945	1,583
ඒකක 02	වාහන හා අමතර කොටස්	197	284	647	385	640
ඒකක 03	රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක , කාර්මික අමුද්‍රව්‍ය ආනයනය හා අපනයනය	3,956	4,313	3,653	4,256	4,881
ඒකක 04	ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත්	5,083	8,982	4,231	5,218	6,136
ඒකක 05	සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන	4,299	3,742	3,443	3,282	3,770
එකතුව		**16,129**	**19,576**	**13,806**	**15,086**	**170,10**

2.3 පසුගිය වසර 3 තුළ නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය

2.3.1 ඖෂධ සහ වෛද්‍ය උපකරණ - ඒකක 1

2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතෙහි 109 වන වගන්තිය ප්‍රකාරව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ලබාදෙන අනුමැතිය යටතේ, ඖෂධ හා වෛද්‍ය උපකරණ සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීමට පෙර ගත යුතු ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග කිහිපයක් සහ ආනයන බලපත්‍ර සඳහා ඇතුළත් කළ යුතු විශේෂ කොන්දේසි මෙම ඒකකය විසින් හඳුනා ගන්නා ලදී. තවද, 2024 වර්ෂයට අදාළව ලබා ගන්නා ලද සමූහ ආනයන බලපත්‍ර භාවිතය පිළිබඳ පසුවිපරමක් සිදු කරන ලද අතර, නිකුත් කිරීමට අදාළ කොන්දේසි සමාලෝචනය සහ පිළියෙල කිරීම සිදුකරන ලදී

2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ නිකුත් කරන ලද මුළු බලපත්‍ර ප්‍රමාණය යම් අඩුවීමක් සිදු වී ඇත. අතර, 2024 වර්ෂයේ ආයතනයන් 03ක් සඳහා නව සමූහ ආනයන බලපත්‍ර නිකුත් කරන ලදී. පෙර වර්ෂයේ දී නිකුත් කරන ලද ආනයන බලපත්‍ර ප්‍රමාණයට වඩා යම් ප්‍රමාණාත්මක අඩුවීමක් 2024 වර්ෂය තුළ පෙන්නුම් කරන අතර,ගෝලීය ආර්ථික අර්බුද හා බැඳුණු දේශිය විනිමය අර්බුදය මෙයට බලපෑ ඇත.

2.3.2 භාවිත කරන ලද මෝටර් රථ සහ වාහන අමතර කොටස් - ඒකක 2

කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් රටේ ඇතිවූ ආර්ථික අස්ථාවරයට පිළියම් වශයෙන් වාහන හා අමතර කොටස් ආනයනය 2020 වර් ෂයේදී තාවකාලිකව අත්හිටුවීම සඳහා රෙගුලාසි පත්කිරීමට මෙම දෙපාර්තමේන්තුවට සිදුවිය. ඒ හරහා විනිමය අනුපාතිකය මතවූ පීඩනය අවම කිරීම මෙහිදී මූලික

අරමුණ විය. මෙම රෙගුලාසි ප්‍රකාශයට පත්වීම තුළින් 2020 වර්ෂයට පෙර පැවති තත්වයට සාපේක්ෂව මෙම ඒකකය මගින් වාහන ආනයනය සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාවෙහි කැපී පෙනෙන විශාල අඩුවීමක් දක්නට ඇත.

එසේ වුවද, රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ අනුව 2021 වසරේදී දේශීය වාහන එකලස් කිරීමේ කර්මාන්තය නගා සිටුවීම උදෙසා අවශ්‍ය පහසුකම් සැපයීමට අප දෙපාර්තමේන්තුවට සිදු විය. ඒ අනුව, 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා බලපත්‍ර පාලනයට යටත් කරමින් වාහන එකලස් කිරීමේ කර්මාන්තකරුවන්ට අවශ්‍ය වාහන අමතර කොටස් සඳහා අවශ්‍ය ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. ඒ අනුව වාහන බඳ කොටස් හා යතුරුපැදි රාමුවල ආනයනයේ කැපී පෙනෙන ඉහල යාම 2021 සිට 2024 වර්ෂවල දත්ත පිරික්සීමේදී පෙනී යයි.

විද්‍යුත් මෝටර් බයිසිකල් සහ පාපැදි ආනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම 2022 අගෝස්තු මස 23 දිනැති අංක 2294/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් සිදු විය. වාහන ආනයනය සඳහා තාවකාලික අත්හිටුවීමක් පවතින මෙම කාලසීමාව තුළ විදේශයන්හි සේවයේ නියුතු මෙරට පුරවැසියන් නැවත ලංකාවට පැමිණෙන විට විද්‍යුත් මෝටර් බයිසිකලයක් හෝ පාපැදියක් රැගෙන ඒම 2022 වර්ෂයේ සිට මේවනවිට ක්‍රමයෙන් අඩුවී ඇත. නමුත්, විද්‍යුත් මෝටර් බයිසිකල් ආනයනය සඳහා නව ආනයනකරුවන් මෙම ක්ෂේත්‍රයට පිවිසීමත් සමග විද්‍යුත් මෝටර් බයිසිකල් ආනයන කර්මාන්තයේ විශාල පිබිදීමක් පෙන්වන බව 2024 ආනයන පාලන බලපත්‍ර දත්තවලින් දැකගත හැකිය.

2022 මාර්තු මස 09 දිනැති අංක 2270/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සහ 2022 අප්‍රේල් මස 31 දිනැති අංක 2274/42 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් වීදුරු භාණ්ඩ, ගෘහ භාණ්ඩ ඉටි පන්දම්, සනීපාරක්ෂක උපකරණ, අව් කණ්නාඩි, ඔරලෝසු, සහ සංගීත භාණ්ඩ යානාදී අයිතම බලපත්‍ර පාලනයට යටත් කිරීමත් සමග මෙම අයිතම සඳහා 2022 වර්ෂයේදී බලපත්‍ර නිකුත් කිරීමෙන් එම වර්ෂයේ ඒකක 2 මගින් නිකුත් කළ සමස්ත බලපත්‍ර ප්‍රමාණය ඉහළ ගොස් ඇත. පසුව එම අයිතම 2022 මැයි මස 31 දිනැති අංක 2282/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් මෙම අයිතම බලපත්‍ර පාලනයෙන් ඉවත් කරන ලදී.

බලපත්‍ර පාලනයට යටත් අයිතමයක් වන හෙල්මට් අතර, ක්‍රිකට් ක්‍රීඩාව සඳහා භාවිතා වන හෙල්මට් සඳහා ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීම 2022 වර්ෂයේ සිට 2024 වර් ෂය දක්වා වූ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරයි.

තවද, 2024 ජුනි මස 28 දිනැති අංක 2390/19 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් නියමුවන් රහිත ගුවන්යානා සඳහා වූ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක (H.S. Code) සමාලෝචනය කිරීම සිදුවීමත් බලපත්‍ර පාලනයට යටත් වීමක් සිදුවිය. ඒ හේතුවෙන් 2024 වර්ෂයේදී මෙම අයිතමය සඳහා ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමේ විශාල ඉහළ යාමක් දැකිය හැකිය.

ඒ අනුව, මෙම ඒකකයෙන් නිකුත් කරන ලද මුළු බලපත්‍රවල 2023 වර්ෂයට සාපේක්ෂව විශාල වර්ධනයක් පෙන්නුම් කරන අතර, 2023 වර්ෂය හැරුණු විට 2020 - 2024 කාලපරිච්ඡේදයේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරයි.

2.3.3 රසායනික ද්‍රව්‍ය, පොහොර, පළිබෝධනාශක හා කාර්මික අමුද්‍රව්‍ය ආනයන හා අපනයන - ඒකක 3

ආනයනය කරනු ලබන පූර්වජ රසායනික ද්‍රව්‍ය, පෙට්‍රෝලියම් ආශ්‍රිත නිෂ්පාදන, විකිරණශීලී ද්‍රව්‍ය, මධ්‍යසාර, අනෙකුත් කර්මාන්ත සඳහා අවශ්‍ය රසායනික, වෙනත් අමුද්‍රව්‍ය ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ලෝහ සුන්බුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම ඒකක 3 මගින් සිදු කෙරේ.
ඒ අනුව, 2024 වර්ෂයේ දී සමස්තයක් ලෙස නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන බලපත්‍ර සංඛ්‍යාව පසුගිය වසර තුනට සාපේක්ෂව ක්‍රමික වර්ධනයක් දක්නට ලැබෙන අතර, දේශීය ආර්ථික වර්ධනය හා

විනිමය අනුපාතවල ස්ථාවරභාවය හේතුවෙන් පූර්වජ රසායනික ද්‍රව්‍ය, පෙට්‍රෝලියම් ආශ්‍රිත නිෂ්පාදන, අනෙකුත් කර්මාන්ත සඳහා අවශ්‍ය රසායනික, වෙනත් අමුද්‍රව්‍ය ආනයන සඳහා නිකුත් කළ බලපත්‍ර සහ ලෝහ සුන්බුන් අපනයනය සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව ඉහළ යාමට හේතු වී ඇති බව නිරීක්ෂණය වේ.

.

2.3.4 ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ හා වෙනත් - ඒකක 4

ජංගම දුරකථන, සන්නිවේදන උපකරණ, ඉලෙක්ට්‍රොනික උපකරණ, , කීයත්, දුරස්ථ පාලක සෙල්ලම් බඩු, වෙඩි බෙහෙත්, වායු රයිෆල් වැනි අයිතම ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ලී අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම මෙම ඒකකය මගින් සිදුකරනු ලැබේ.

2022 වර්ෂයේ සිට මේ දක්වා දුරස්ථ අධ්‍යාපන රටාවත් සමඟ ජංගම දුරකථන භාවිතය ඉහළ යාම හේතුවෙන් 615 කාණ්ඩය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණය ඉහළ ගොස් ඇති අතර, සමස්ථයක් ලෙස මෙම අංශයෙන් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාත්මක ඉහළ අගයක් ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

2.3.5 සතුන්, සත්ත්ව නිෂ්පාදන හා විවිධ ආනයන - ඒකක 5

2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂය තුළ නිකුත් කර ඇති මුළු බලපත්‍ර සංඛ්‍යාව ඉහළ අගයක් පෙන්වන අතර කාණ්ඩ වශයෙන් සැලකීමේදී ඇතැම් කාණ්ඩ සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව 2023 වර්ෂය හා සැසඳීමේදී අඩු අගයක් ගනී.

අංක අමප/24/0904/612/047හා 2024.05.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින්, 2024 ජුනි මස සිට දෙසැම්බර් මස දක්වා බඩ ඉරිඟු මෙට්‍රික්ටොන් 300,000ක් සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා , ආනයන බලපත්‍ර ලබාදීමට අනුමැතිය ලබා දී ඇති අතර, ඒ සඳහා කාණ්ඩ අංක 550 යටතේ ආනයන පාලන බලපත්‍ර 2222 ක් නිකුත් කරන ලද අතර, එම බලපත්‍ර ප්‍රමාණය 2023 වර්ෂයට වඩා සාපේක්ෂව ඉහළ අගයක් ගෙන ඇත.

අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක 24/0819/612//015 හා 2024.02.06 දිනැතිව ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, දේශීය පාරිභෝජනය සඳහා ලෙලි කජු මෙට්‍රික් ටොන් 15,000ක් සඳහා ආනයන බලපත්‍ර ලබා දීමට අනුමැතිය ලබා දී ඇති බැවින්, මේ සඳහා ලබා දී ඇති බලපත්‍ර ප්‍රමාණය 2023 වසර හා සැසැඳීමේ දී වැඩි අගයක් ගෙන ඇත.

කාණ්ඩ අංක 580 යටතේ තේ කොළ ආනයනය සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව 2023 වසරේ 550 ක් ද 2024 වර්ෂයේ 687 ක් ලෙසත් පෙන්නුම් කරන අතර, එය මෙම කාණ්ඩය තුළ සාපේක්ෂ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

2023 වර්ෂය තුළ කාණ්ඩ අංක 815 යටතේ, සකස් කරන ලද පිටි, පිෂ්ඨය, මෝල්ට් සඳහා ආනයන බලපත්‍ර 358ක් නිකුත් කර ඇති නමුත්, 2024 වර්ෂයේ මෙම කාණ්ඩය සඳහා ආනයන බලපත්‍ර නිකුත් නොකිරීම ද විශේෂත්වයකි.

2023.12.19 දිනැති අංක 23/2457/627/032 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින්, කීරි සම්බා සහල් වර්ගයට සමාන GR -11 සහල් වර්ගයෙන් මෙට්‍රික්ටොන් 50,000ක ප්‍රමාණයක් ආනයනය කිරීමට අවසර දීමත් සමඟ, 2024 වර්ෂයේ 527 කාණ්ඩය ජනවාරි මාසය තුළ බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කිරීමත් සමඟ පසුගිය වසරට සාපේක්ෂව 527 කාණ්ඩය ඔස්සේ ලබා දී ඇති බලපත්‍ර ප්‍රමාණය සාපේක්ෂ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

2.4 ආනයන හා අපනයන ගෙවීම් ක්‍රම සහ නියෝග

වාණිජ අරමුණින් සිදුකරනු ලබන ජාත්‍යන්තර වෙළඳ ගනුදෙනු නියාමනය කිරීමද දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. ඒ වෙනුවෙන් විදේශ වෙළඳ ගෙවීම් ක්‍රම අංක 1739/03 හා 2012.01.02 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත්කර ඇති අතර, එම ගෙවීම් ක්‍රම පහත සඳහන් වේ. තවද, මෙම ගෙවීම් ක්‍රම සම්බන්ධයෙන් වාණිජ බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිරන්තරයෙන් නිකුත් කරනු ලැබේ.

1. පෙර ගෙවීම් (**Advanced Payments)**
2. පිළිගැනීම මත ලේඛන (**Documents against Acceptance - DA)**
3. ණයවර ලිපි (**Letters of Credit - LC)**
4. ගෙවීම් මත ලේඛන (**Documents against Payment)**
5. විවෘත ගිණුම් (**Open Accounts - OA)**
6. භාණ්ඩ විකුණා මුදල් ගෙවීමේ පදනම (**Payments on Consignment Account Basis)**

ඉහත සඳහන් ගෙවීම් ක්‍රමවලට අදාළ රෙගුලාසිවලට අනුකූල වන ලෙස භාණ්ඩ ආනයනය කර නොමැති අවස්ථාවලදී හෝ ගෙවීම් කර නොමැති විට දී එම භාණ්ඩ ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කිරීමට පෙර සහ ආනයනයට අදාළ ගෙවීම් කිරීම හා ඊට අදාළ කරුණු සැලකිල්ලට ගෙන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දෙනු ලැබේ. ඒ අනුව, එලෙස 2024 වර්ෂයේ දී ලබාදුන් අනුමැතීන් පහත පරිදි වේ.

2024 වර්ෂයේ දී ඒකක 02 මගින් ලබාදෙන ලද අනුමැතීන්									
මාසය	අනුමැතීන් වර්ග								
	පෙර ගෙවීම	පිළිගැනීම මත ලේඛන සඳහා වන ගෙවීම	විවෘත ගිණුම මත ගෙවීම	නැති අපනයන	ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්ත වලින් ඉවතලන ද්‍රව්‍ය දේශීය වෙළඳපොළට නිකුත් කිරීම	විද්‍යුත් ලේඛණ සහ ණයවර ලිපි මත ගෙවීම	විදේශ විනිමය වැය නොවන පදනම මත ආනයනයන්	වෙනත්	මුළු එකතුව
ජනවාරි	5	52	75	4	3	28	0	12	179
පෙබරවාරි	8	62	63	2	2	29	0	12	178
මාර්තු	6	48	48	1	4	20	0	8	135

අප්‍රේල්	5	60	59	2	0	21	0	7	154
මැයි	7	53	56	3	0	20	1	11	151
ජූනි	5	61	25	3	0	19	1	13	127
ජූලි	11	63	77	4	0	22	0	8	185
අගෝස්තු	7	30	42	2	0	22	3	8	114
සැප්තැම්බර්	5	53	41	3	0	14	1	18	135
ඔක්තොම්බර්	4	54	37	2	0	15	0	12	124
නොවැම්බර්	8	44	31	2	0	10	0	7	102
දෙසැම්බර්	2	47	44	8	0	14	1	11	127
මුළු එකතුව	**73**	**627**	**598**	**36**	**9**	**234**	**7**	127	**1711**

2.5. ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන නියාමනය හා පහසුකරණය

2.5.1 ආනයන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) නියෝග

මෙරට පාරිභෝගිකයන්හට, උසස් ප්‍රමිතියකින් හා ඉහළ ගුණාත්මකභාවයකින් යුක්ත ආනයනික භාණ්ඩ භාවිත කිරීමට සහතික කිරීම සඳහා ආනයනික භාණ්ඩ ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූල වීම අනිවාර්ය කරමින් හා යාවත්කාලීන කෙරෙන ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන රෙගුලාසි කලින් කලට නිකුත් කරනු ලැබේ. ඒ අනුව, දැනට ක්‍රියාත්මකව පවතින 2018 මාර්තු මස 29 දිනැති අංක 2064/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන රෙගුලාසි සංශෝධනය කිරීමේ අවශ්‍යතාව දෙපාර්තමේන්තුව විසින් හඳුනාගනිමින් ඒ සඳහා අදාළ ක්‍රියාමාර්ගවලට 2023 වර්ෂයේ දී අවතීර්ණ විය.

තාක්‍ෂණයේ දියුණුව, නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම, තත්ත්ව වැඩිදියුණු කිරීම, මහජන සෞඛ්‍ය සහ පරිසරය ආරක්ෂා කිරීම ආශ්‍රිත ගැටලු ඉහළ යෑම සැලකිල්ලට ගනිමින්, කඩිනම්, ආරක්ෂිත සහ ඵලදායී වෙළඳ ප්‍රවාහයන්ට පහසුකම් සැලසීමට සහ දේශීය නිෂ්පාදන සහ ආනයනික නිෂ්පාදන සඳහා සාධාරණ සහ සමානාත්මතාවයකින් යුතු පරිසරයක් ඇති කිරීම සම්බන්ධයෙන් පවතින ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන් යාවත්කාලීන කිරීම සහ නව ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන් හඳුන්වා දීමේ අවශ්‍යතාවය අනුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් රාජ්‍ය ආයතන, ව්‍යාපාරික සංගම්, සහ වාණිජ මණ්ඩල ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර, පවතින ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන් (2017 ආනයන හා අපනයන පාලන (ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන) රෙගුලාසිවල නිශ්චිතව දක්වා ඇති) සංශෝධනය කරමින් යාවත්කාලීන කර ඇති අතර නැගී එන නිෂ්පාදන තාක්ෂණය, පරිභෝජන රටා සහ වෙළඳ ප්‍රවාහයට මුහුණ දීම සඳහා නව ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන් ස්ථාපිත කරන ලදී.

මේ අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් 2024 පෙබරවාරි මස 28 දිනැති අංක 24/0466/604/056 දරන සංදේශය මගින් යෝජනා කර ඇති පරිදි, යාවත්කාලීන කරන ලද ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන් ක්‍රියාත්මක කිරීම සඳහා වන රෙගුලාසි පැනවීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2024 මාර්තු මස11 දින අනුමැතිය ලබා දෙන ලද අතර, ඒ අනුව, ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පනවමින්, 2024 මැයි මස 17 වැනි දිනැති අංක 2384/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කරන ලදී.

2.5.2 එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1540 දරන යෝජනාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම

න්‍යෂ්ටික, රසායනික, ජීව විද්‍යාත්මක අවි සහ ඒවා ඉලක්කගත කරන ක්‍රම ව්‍යාප්ත වීම අන්තර්ජාතික සාමයට තර්ජනයක් වන බැවින්, එම අවි අත්පත් කර ගැනීම, සන්තකයේ තබා ගැනීම සහ ලබා දීම, ප්‍රවාහනය සහ භාවිතය සඳහා රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ට සහයෝගය ලබා දීම වැළැක්විය යුතු ය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1540 යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා රෙගුලාසි පැනවීම මඟින් න්‍යෂ්ටික, රසායනික සහ ජීව විද්‍යාත්මක අවි ආශ්‍රිත ද්‍රව්‍ය සාමකාමී අරමුණු වෙනුවෙන් අපනයනය, ප්‍රති-අපනයනය, සංක්‍රමණය කිරීම (Transit) සහ නැව් මාරු කිරීම (Trans -shipment) අදාළ නීති අනුව, සිදුවිය යුතු බව දැක්වේ. එහෙත්, එම කරුණු ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි නීති සම්පාදනය වී නොමැති බැවින්, ශ්‍රී ලංකාව විසින් ද මෙම උපායමාර්ගික භාණ්ඩ අපනයනය සම්බන්ධයෙන් මනාව සැලසුම්කරණය කළ නීතිමය රාමුවක් සකස් කළ යුතුව ඇත. මෙලෙස අන්තර්ජාතික සම්මුතියක් ක්‍රියාත්මක කිරීම තුළින් මෙරටෙහි වගකීමක් හා වගවීමක් නිරූපණය වන අතර, එමඟින් ප්‍රතිලාභ රැසක් ශ්‍රී ලංකාවට අත් වනු ඇත.

ඉහත අවශ්‍යතාවන්ට අනුගතව 1540 දරන යෝජනාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා 2019 සැප්තැම්බර් මස 11 වන දින අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය එකඟතාව ලැබී ඇත. එසේම, එම යෝජනාව ඵලදායීව ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය නීතිමය හා තාක්ෂණික සහාය ලබා දීම සඳහා නීති සම්පාදන කමිටුව සහ තාක්ෂණ කමිටුව වශයෙන් රාජ්‍ය ආයතනවලින් සැදුම්ලත් කමිටු ද්විත්වයක් අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පත් කර ඇත. එම තාක්ෂණික කමිටුව විසින් යුරෝපා සංගම් යුධ උපකරණ ලැයිස්තුව (EU Military list) සහ යුරෝපා සංගම් ද්වි භාවිත පාලන ලැයිස්තුව (EU Dual – Use Control List) ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ යන භාෂාත්‍රයෙන් පිළියෙල කර ඇත.

එහෙත්, දැනට මේ සඳහා ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2019 දී බැවින් එය කල්ගත වූ තීරණයක් නිසාවෙන්, ඒ සඳහා වර්තමාන අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය එකඟතාව ලබා ගැනීම සුදුසු බවට නීති කෙටුම්පත් සම්පාදක විසින් අදහස් දක්වා තිබුණි. ඒ අනුව සකස් කළ නව අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා 2023 ජනවාරි මාසයේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබිණි.

තවද, එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට විධිවිධාන සැලසීම සඳහා උපායමාර්ගික වෙළෙඳ කළමනාකරණ පනත (Strategic Trade Management Act) කෙටුම්පත් කරන ලද අතර එය නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කරන ලදී. මෙහිදී 1540 දරන යෝජනාව ශ්‍රී ලංකාව තුළ වඩාත් ඵලදායී ව ක්‍රියාත්මක කිරීම සඳහා පත් කළ නීති සම්පාදන කමිටුවේ, එක්සත් ජාතීන්ගේ 1540 වන යෝජනාව සම්බන්ධයෙන් කටයුතු කරන විෂයය විශේෂඥයන්ගේ නිරීක්ෂණ මෙන් ම, ආසියා ශාන්තිකර කලාපයේ රටවල දැනට ක්‍රියාත්මක වන උපායමාර්ගික වෙළෙඳ කළමනාකරණ පනත් ද අධ්‍යයනයකර සකස් කරන ලද මෙම පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. ඒ පිළිබඳ නීති කෙටුම්පත් සම්පාදකගේ නිරීක්ෂණ මත පදනම් ව ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමු වීමට නියමිත ය.

2.5.3 පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතිකය (Pre-Shipment Inspection Certificate)

භාවිත කළ වාහන ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේදී එම වාහන නියමිත වායු විමෝචන ප්‍රමිතීන් සහ ආරක්ෂක මිනුම් ප්‍රමිතිවලට අනුකූල ද යන්න පරීක්ෂා කළ යුතු බැවින්, ඒ සඳහා පූර්ව නැව්ගත කිරීමේ පරීක්ෂණ සහතිකය ලබාගත යුතු බලයලත් පරීක්ෂණ ආයතන ඇතුළත් කර 2013 අප්‍රේල් මස 04 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කර තිබේ.

2020 වර්ෂයේ සිට වාහන ආනයනය, කොවිඩ් -19 ගෝලීය වසංගතය නිසා ඇති මූල්‍යමය අර්බුදය හේතුවෙන් තාවකාලිකව අත්හිට වූ අතර, මෙම හේතුව නිසා වාහන සඳහා වන පූර්ව නැව්ගත පර්යේෂණ සහතික නිකුත් කරනු ලබන බලයත් පරීක්ෂණ ආයතන සංඛ්‍යාව වැඩි කිරීමේ ක්‍රියාවලිය තාවකාලිකව නවතා තිබුණි.

කෙසේ වෙතත්, 2024 වර්ෂය වන විට රට තුළ ඇති වූ මූල්‍යමය අර්බුදකාරී තත්ත්වය ක්‍රමිකව ප්‍රකෘති තත්ත්වයට පත්වීමත් සමඟ, වාහන ආනයනය පිළිබඳ රජයේ අවධානය යොමු කරමින්, යම් යම් වාහන කාණ්ඩ ආනයනය සඳහා පැවති තාවකාලික තහනම ඉවත් කරනු ලැබීමත් සමඟ, පූර්ව නැව්ගත පරීක්ෂණ සහතික නිකුත් කිරීමේ ආයතන සංඛ්‍යාව වැඩි කිරීම සඳහා වූ ක්‍රියාවලිය නැවත පණගන්වමින්, 2019 දී විශේෂ තාක්ෂණ කමිටුව මඟින් තෝරාගත් ආයතන වෙතින් නැවත යෝජනා කැඳවා, පසුව සුදුසු ආයතන තෝරා ගැනීම සඳහා වන මූලික ක්‍රියාමාර්ග සකස් කරනු ලැබිය.

2025 වර්ෂයේ මුල් කාර්තුව තුළ එම ආයතන තෝරා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. එමඟින් ඉදිරියේදී ආනයනකරුවන්ට, වාහන ආනයනයේ දී මුහුණපෑමට සිදුවන දුෂ්කරතා අවම කරගැනීමට හා ඒවා මිලදී ගන්නා පාරිභෝගිකයන්ගේ ආරක්ෂාවද තහවුරු කරගැනීමට ඉඩකඩ සැලසෙනු ඇත.

2.5.4. ආනයන පාලන රෙගුලාසි උල්ලංඝනය කරනු ලබන ආනයන කරුවන්ගේ අසාධුගත නාම ලේඛනය ප්‍රසිද්ධ කිරීමේ ගැසට් නිවේදනය

ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මඟින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූල නොවන ආනයනයන් සිදු කරන ආනයනකරුවන්ගේ ලේඛනය ප්‍රසිද්ධ කිරීම, ජාතික ආර්ථිකය, මහජන සෞඛ්‍ය හා ආරක්ෂාව මෙන්ම පාරිසරික සුරක්ෂිතතාව තහවුරු කිරීමේ සමාජ වගකීම ඉටු කිරීමේ දර්ශකයකි. එබැවින් ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මඟින් නියම කර ඇති ප්‍රමිතින්ට අනුකූල නොවන ආනයනයන් සිදු කරන ආනයනකරුවන්ගේ ලේඛනය ප්‍රසිද්ධ කිරීමට අදාළ විධිවිධාන මේ යටතේ සලසා ඇත.

මෙම ගැසට් නිවේදනය සම්බන්ධන්ධව, නීතිපති දෙපාර්තමේන්තුවෙන් වෙතින් එවන ලද නිරීක්ෂණ ඇතුළත් කරමින් කෙටුම්පත් කරන ලද ගැසට් නිවේදනය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

2.5.5 ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රතිපත්තිමය රාමුව සකස් කිරීම හා ආනයන හා අපනයන බලපත්‍ර කොන්දේසි සමාලෝචනය කිරීම.

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන බලපත්‍ර සඳහා, නිර්දේශ ලබාදෙන ආයතන නිශ්චිත ලෙස හඳුනා ගැනීමත්, එම නිර්දේශ ලබාදෙන ආයතනවලට අයත් අයිතම නිවැරදි ලෙස හඳුනාගැනීමත්, එමඟින් අදාළ අයිතම ආනයනය සඳහා, එම අදාළ ආයතන මඟින්ම, පැහැදිලි නිර්දේශයන් නිකුත් කිරීම අරමුණු කර ගනිමින් ඉහත සඳහන් ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම ආරම්භ කරන ලදි.

එහි මූලික පියවර ලෙස, ආදාළ ආනයන බලපත්‍ර නිකුත් කරනු ලබන ඒකක මඟින් එක් එක් බලපත්‍ර අයිතතම සඳහා සාම්ප්‍රදායිකව නිර්දේශ නිකුත් කරනු ලබන ආයතන වෙන වෙනම හඳුනාගන්නා ලද අතර, එම ආයතන පිළිබඳ ගැටළු සහිත අවස්ථා හඳුනා ගැනීම හා එම ගැටළු නිරාකරණය සඳහා ඒ ඒ නිර්දේශ ලබා දෙන ආයතන මෙම දෙපාර්තමේන්තුව වෙත කැඳවා සාකච්ඡා පවැත්වීම සිදු කරන ලදී. ඒ අනුව, එම ආයතන මඟින් පමණක් ආනයන බලපත්‍ර සඳහා නිර්දේශ ලබා ගැනීමට හැකි වන පරිදි නව ක්‍රමවේදයක් සකස් කරන ලදි.

එමෙන්ම, බලපත්‍ර සඳහා ඇතුළත් කරනු ලබන විවිධ කොන්දේසි පිළිබඳ දීර්ඝව සාකච්ඡා කරන ලද අතර, බලපත්‍ර කොන්දේසි එක් එක් ඒකක, කාණ්ඩ, අනුව හඳුනා ගන්නා ලදී. ඒ අනුව, මෙතෙක් පැවැති බලපත්‍ර කොන්දේසි විධිමත් පරිදි සමාලෝචනය කර සකස් කිරීමට කටයුතු කරන ලදී.

ඊට අමතරව, එක් එක් ඒකක විසින් බලපත්‍ර නිකුත් කිරීමේ දී පැවැති ගැටළු සහගත තත්ත්වයන් හඳුනාගෙන ගෙන, එම ගැටළු සියල්ලම නිරාකාරණය කිරීමට ද කටයුතු කරන ලදී.

ඒ අනුව, 2025.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි, නව පරිගණක පද්ධතිය මඟින් නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා, එක් එක් කාණ්ඩ වලට අදාළව කොන්දේසි , ඒකක සියල්ලටම වෙන් වෙන් වශයෙන් සකස් කර, අභ්‍යන්තර උපදෙස් ලබා දීම 2024.12.31 දින වන විට සිදු කර අවසන් කරන ලදි.

2.6 නව වැඩිදියුණු කිරීම්

2.6.1 ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇති STRATLINK පරිගණක මෘදුකාංග පද්ධතිය

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කටයුතු සුහුරු සමාජයට (Smart Society) ගැළපෙන පරිදි, සකස් කිරීමේ අරමුණින්, කාලයක් සිට පැවති ඉලෙක්ට්‍රොනික බලපත්‍ර නිකුත් කිරීමේ පහසුකම සැපයීම යථාර්ථයක් බවට පත් කර ගැනීමට 2024 වර්ෂයේ දී හැකි විය. ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ඉල්ලීම පරිදි විද්‍යුත් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ අංක 1540 දරන යෝජනාවේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා ආධාර සැපයීම අරමුණු කොටගෙන, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අපනයන පාලන හා ආශ්‍රිත දේශසීමා ආරක්ෂක කාර්යාංශය (EXBS වැඩසටහන) විසින් පරිත්‍යාගයක් ලෙස STRATLINK පරිගණක පද්ධතිය ලබා දීමට එකඟ විය.

එම පද්ධතිය සම්බන්ධව ඉදිරිපත් කළ යෝජනා සඳහා අංක අමප/23/0077/604/004 හා 2023.01.31 දිනැති තීරණය මඟින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

ඒඅනුව, මෙම පද්ධතිය භාවිතයෙන් ඉලෙක්ට්‍රොනික ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබූ අතර, 2024 ඔක්තෝබර් මස 25 වැනි දින අග්‍රාමාත්‍ය ලේකම් සහ ඇමරිකා එක්සත් ජනපද තානාපති නියෝජිත ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී STRATLINK ඉලෙක්ට්‍රොනික බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය නිල වශයෙන් දියත් කරන ලදි.

සේවාලාභින්ට ඉතා පහසුවෙන් හැසිරවිය හැකි අතුරු මුහුණතකින් මෙම පද්ධතිය සමන්විත වේ. සේවාදායකයන් ලෙස යම් ආයතනයක් විසින් මෙම පද්ධතිය තුළ ලියාපදිංචි වීම ප්‍රථමයෙන්ම සිදුකළ යුතුය. එලෙස ලියාපදිංචි වන සමාගමක නිත්‍යානුකූලතාවය සමාගම් ලියාපදිංචි දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය හරහාද, පෞද්ගලික ආනයනකරුවෙකුගේ නිත්‍යානුකූලභාවය පිළිබඳව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය හරහාද තහවුරු කරගැනීමට ඇති අවකාශය පිළිබඳ දැනටමත් එම ආයතන සමඟ අප විසින් සාකච්ඡා පවත්වා ඇත. එසේම, බලපත්‍ර ගාස්තු හා අතිරේක ගාස්තු ගෙවීම්, රාජ්‍ය ගෙවීම් ජාලය (Lanka Pay (Pvt) Ltd) හරහා සිදුකිරීමට නව පරිගණක පද්ධතිය තුළ පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

එමෙන්ම, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සමඟ අවියෝජනීයව කටයුතු කළ යුතු ආයතනයක් වන්නේ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවයි. STRATLINK දත්ත පද්ධතිය රේගු දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අදාළ වන පරිදි තාක්ෂණික පහසුකම ඇති කර ගැනීම අත්‍යවශ්‍ය කටයුත්තක් බැවින්, ඊට අදාළවන යෙදුම් වැඩසටහන් අතුරුමුහුණත් (API - Application Program Interface) වල සංවර්ධන කටයුතු සිදු කරන ලදි.

2025 වර්ෂයේ දී සම්පූර්ණයෙන්ම STRATLINK පද්ධතිය නවීනතම පහසුකම් වලින් සමන්විත තොරතුරු තාක්ෂණ මෙවලමක් ලෙස දෙපාර්තමේන්තුවේ සේවාලාභීන් වෙත ලබාදීමට හැකිවනු ඇත.

තවද, මෙම STRATLINK ඉලෙක්ට්‍රොනික බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂම, සඵලදායීව සිදු කිරීමේ අරමුණින්, එස්තෝනියා රජයේ නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් ආවරණය වන පරිදි පුහුණු සැසිවාර කිහිපයක් ඔස්සේ දැනුම්වත් කිරීම් සිදු කරන ලද අතර, මෙම දෙපාර්තමේන්තුව සඳහා සම්බන්ධවන සේවාලාභීන් ආවරණය වන පරිදි මෙම පද්ධතිය සම්බන්ධයෙන් දැනුම්වත් කිරීම් සිදු කිරීම පසුගිය වර්ෂයේ අවසාන කාර්තුවේ දී සිදු කරන ලදි.

2.6.1.1 STRATLINK පද්ධතිය මඟින් සේවාලාභීන්ට ලැබෙන ප්‍රතිලාභ



STRATLINK පද්ධතිය වෙත සේවාලාභීන් ලියාපංදිංචි කිරීම 2024 නොවැම්බර් මස සිට ආරම්භ කරන ලද අතර, එහිදී, සමූහ බලපත්‍ර සඳහා වන අයදුම්පත්‍ර යොමු කිරීමේ පහසුකම දෙසැම්බර් පළමුවැනිදා සිට සහ අනෙකුත් බලපත්‍ර සඳහා වන අයදුම්පත්‍ර යොමු කිරීමේ පහසුකම 2025 වර්ෂයේ ජනවාරි පළමුවැනිදා සිට සේවාදායකයින් වෙත ලබා දෙන ලදී. ඒ අනුව, STRATLINK පද්ධතිය භාවිතය මඟින් සේවාදායකයින් වෙත පහත සඳහන් ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වේ.

- නව පද්ධතිය මඟින් ආනයන හා අපනයන පාලන බලපත්‍ර සඳහා වන අයදුම්පත් සහ හරපත්‍ර සඳහා වන අයදුම්පත් මාර්ගගතව යොමුකිරීමේ පහසුකම සේවාලාභීන්ට හට හිමිවේ.
- සේවාදායකයින් විසින් යොමුකරන ලද බලපත්‍ර/හරපත්‍ර වල වර්තමාන ඇගයීම් තත්ත්වය පිළිබඳව ප්‍රතිශතාත්මක අගයක් සේවාලාභීන්ට මෙම පද්ධතිය හරහා දර්ශනය වීමේ පහසුකම හිමිවන අතර, ඒ අනුව, අදාළ බලපත්‍රය / හරපත්‍රය කුමන පියවරේ පවතීද යන්න ඔවුන්ට දැන ගැනීමේ හැකියාව හිමි වේ.
- අයදුම්පත්‍රයේ අඩුපාඩු ඇත්නම් ඒවා පද්ධතිය හරහාම අයදුම්කරු වෙත යොමු කරනු ලබන අතර ඒවා නිවැරදි කිරීමෙන් පසු නැවත යොමු කිරීමේ පහසුකම ද සේවාලාභීන්ට ලබා දී ඇත. එමඟින් අදාළ අඩුපාඩු සහිත කොටස පමණක් නැවත නිවැරදිකර ගැනීමට සේවාලාභීන් වෙත අවස්ථාව හිමි වේ.
- බලපත්‍ර/හරපත්‍ර අනුමත වීමෙන් පසු එම තොරතුරු ඊමේල් හා කෙටි පණිවිඩ මඟින් සේවාලාභීන්ට වෙත ස්වයංක්‍රීයව දැනුම්දීම සිදු වේ.
- බලපත්‍ර/හරපත්‍ර අනුමත වීමෙන් පසු ඒ සඳහා වන ගෙවීම් වවුචරපත් සේවාලාභීන්ගේ පරිශීලක ගිණුමට ඇතුළුවීමෙන් බාගත කර ගත හැකි වේ.
- අදාළ ගෙවීම් ලංකා රාජ්‍ය ගෙවීම් ජාලය මඟින් මාර්ගගතව ඉතා ඉක්මණින් සිදුකිරීමේ පහසුකම සේවාලාභීන්ට හිමිවේ. එමඟින් දවසේ ඕනෑම අවස්ථාවක ගෙවීම් සිදුකිරිමට සේවාලාභීන්ට අවස්ථාව හිමි වේ.
- මෙතෙක් මුද්‍රණය කර ලබාදුන් බලපත්‍රය හා හරපත්‍රය වෙනුවට ඉලෙක්ට්‍රොනික බලපත්‍රයක් (ඊ-බලපත්‍රයක්) හා හරපත්‍රයක් ලබාදීම නව පද්ධතිය මඟින් සිදුකෙරේ. ඒ අනුව, අදාළ ගෙවීම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එම ඊ- බලපත්‍රය/ හරපත්‍රය සේවාලාභීන්ට බාගත කර ගැනීමේ පහසුකම ලැබේ.

- ශ්‍රී ලංකා රේගුවේ ASYCUDA පද්ධතිය සමඟ STRATLINK පද්ධතිය සම්බන්ධකර ඇති බැවින්, අදාළ බලපත්‍ර තොරතුරු ස්වයංක්‍රීයව ශ්‍රී ලංකා රේගුව වෙත යොමුවේ. එමෙන්ම බලපත්‍ර හරකිරීමේ අවශ්‍ය වන රේගු ප්‍රකාශන තොරතුරු ASYCUDA පද්ධතිය මඟින් STRATLINK පද්ධතිය වෙත ලැබේ. එමෙන්ම බලපත්‍ර හරකිරීමෙන් පසු භාණ්ඩ නිශ්කාෂණය සඳහා වන අනුමැතීන් ද ශ්‍රී ලංකා රේගුව වෙත ස්වයංක්‍රීයව යොමු කරන අතර, මේ හරහා බලපත්‍ර හරකිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම ඉටු කිරිමට හැකියාව ලැබී ඇත.

මීට අමතරව, සේවාලාභීන්ට වෙත පහත සඳහන් පහසුකම් ද STRATLINK පද්ධතිය මඟින් හිමිවේ.

- පෙර නිකුත් කරන ලද බලපත්‍ර හා හරපත්‍ර පිළිබඳ තොරතුරු ලබා ගැනීම.
- ආනයන හා අපනයන පාලනයට යටත් කර ඇති සංයෝජිත වර්ගීකර්ණ සංකේතාංක පිළිබඳව දැන ගැනීම.
- බලපත්‍ර සඳහා වන සැපයුම් කරුවන්ගේ තොරතුරු ඇතුළත් කිරීමේදී අදාළ භාණ්ඩ සඳහා පවතින සම්බාධක පනවා ඇති රටවල් සහ පුද්ගලයින් පිළිබඳව දැන ගැනීමේ හැකියාව .
- සේවාලාභින් වෙත පරිශීලක ගිණුම හරහා දෙපාර්තමේන්තුව විසින් නිවේදනය කරනු ලබන විශේෂ නිවේදන දැන ගැනීමේ අවකාශය.

2.6.1.2. STRATLINK පද්ධතියේ ඉදිරි සංවර්ධන කටයුතු

සේවාලාභීන් STRATLINK පද්ධතිය වෙත ලියාපදිංචි කිරීමට අවශ්‍ය වන තොරතුරු, ඊට අදාළ රාජ්‍ය ආයතන පද්ධති සමඟ ඒකාබද්ධ කිරීමෙන් ලබා ගැනීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. ඒ අනුව, සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපංදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා ආගමන විගමන දෙපාර්තමේන්තුව සමඟ ඉදිරියේදී මෙම පරිගණක පද්ධතිය ඒකාබද්ධ කිරීමට මූලික සැලසුම් සකස් කර ඇති අතර, එමඟින් දත්තවල නියත බව (Consistency) පවත්වා ගැනීමට හැකියාව ලැබේ.

තවද, STRATLINK පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු හඳුනාගන්නා ලද වැඩිදියුණු කිරීම් හා සිදුකළ යුතු වෙනත් සංවර්ධන කටයුතු 2025 වර්ෂයේ මුල් කාර්තුව අවසානයේදී STRATLINK දෙවන අදියරේ දී කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

2.6.1.3. පැවති පරිගණක පද්ධතිය හා නව STRATLINK පද්ධතියේ ක්‍රියාකාරකම් පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහය

පැවති පරිගණක පද්ධතිය	නව පරිගණක පද්ධතිය
මාර්ගගත හා මාර්ගගත නොවන ලෙස පද්ධති කොටස් දෙකක් ඒකාබද්ධකර ක්‍රියාත්මක විය. ඒ අනුව, නිලධාරීන් හට පද්ධති දෙකකට ප්‍රවේශ වීමෙන් අයදුම්පත්‍ර ඇගයීම් කටයුතු සිදුකළ යුතු වේ.	සම්පූර්ණ තනි මාර්ගගත පද්ධතියක් ලෙස සංවර්ධනය කර ක්‍රියාත්මක කර ඇත. එබැවින් එක් ප්‍රවේශයකින් බලපත්‍ර/ හරපත්‍ර ඇගයීම් කටයුතු සිදුකළ හැකි වේ.

පැවති පරිගණක පද්ධතිය	නව පරිගණක පද්ධතිය
බලපත්‍ර පමණක් මාර්ගගතව ලබා ගන්නා ලද අතර, හරපත්‍ර ක්‍රියාවලිය මාර්ගගත නොවන පද්ධතිය මඟින් සිදුකරන ලදී. එහිදී, සේවාලාභීන්ට බලපත්‍ර හරකිරීම් සඳහා දෙපාර්තමේන්තුව වෙත පැමිණීමට සිදුවිය.	බලපත්‍ර හා හරපත්‍ර යන අයදුම්පත් දෙවර්ගයම මාර්ගගතව ලබා ගැනීම සිදුකරන බැවින් සේවාලාභීන්ට දෙපාර්තමේන්තුව වෙත පැමිණීමෙන් තොරව මාර්ගගතව අදාළ අයදුම්පත්‍ර යොමු කළ හැකි වේ.
මුද්‍රිත බලපත්‍රයක් හා හරපත්‍රයක් නිකුත් කරන ලදී. ඒ අනුව ගාස්තු ගෙවීමෙන් අනතුරුව බලපත්‍ර / හරපත්‍ර ලබා ගැනීමට සේවාලාභීන්ට දෙපාර්තමේන්තුව වෙත පැමිණිය යුතු වේ.	ඉලෙක්ට්‍රොනික බලපත්‍රයක් හා හරපත්‍රයක් නිකුත් කරනු ලබන බැවින්, ගෙවීම් සිදුකිරීමෙන් අනතුරුව පරිශීලක ගිණුම තුළින් බලපත්‍රය/ හරපත්‍රය බාගත කර ගැනීමට හැකි වේ.
බලපත්‍ර හා හරපත්‍ර පිළිබඳ දත්ත වාර්තා ලබා ගැනීමේදී පූර්ව නිශ්චිත වාර්තා පමණක් ලබා ගැනීමේ පහසුකම පැවති අතර, අභිරුචිකරණය කළ වාර්තා ලබාගැනීමට පහසුකම් නොතිබිණි.	වාර්තා ලබා ගැනීමේදී පූර්ව නිශ්චිත හා අභිරුචිකරණ වාර්තා යන ආකාර දෙකෙන්ම වාර්තා ලබා ගැනීමේ පහසුකම පවතී.
බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදෙන ආයතන සමඟ පද්ධති ඒකාබද්ධතාවයක් හෝ වෙබ් ප්‍රවේශ අතුරුමුහුණත් සම්බන්ධතාවයක් නොතිබුණි.	නිර්දේශ ලබාදෙන ආයතන සමග අදාළ නිර්දේශ පද්ධතිය හරහා ලබාගැනිමට හා සේවාදායකයින් විසින් යොමුකරන ලද නිර්දේශ සත්‍යාපනය කරගැනීමට අදාළ ආයතන වෙත වෙබ් අතුරු මුහුණත් ලබාදීමට කටයුතු කර ඇත.
වාණිජ බැංකු සමඟ පැවති පද්ධතිය සම්බන්ධතාවයක් නොපැවතුනි.	නව පද්ධතිය මඟින් බලපත්‍ර තොරතුරු සත්‍යාපනය කර ගැනිම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත වෙබ් අතුරුමුහුණත් සම්බන්ධතාවයක් ලබා දී ඇත.
පද්ධතිය දෙපාර්තමේන්තුවේ පරිශ්‍ර සත්කාරත්වයේ පවතී.	නව පද්ධතිය ක්ලවුඩ් (cloud) සත්කාරකත්වය යටතේ පවතී.

3 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තත්‍ය 2024 රු.	තත්‍ය 2023 රු.	
-	ආදායම් ලැබීම්		3,762,583,369	3,304,992,140	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
3,100,000,000	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	3,762,583,369	3,304,992,140	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		**3,762,583,369**	3,304,992,140	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		128,344,250	100,498,000	ඒසීඒ-3
-	තැන්පතු		488,608	6,700,573	ඒසීඒ-4
3,800,000	අත්තිකාරම් ගිණුම්		6,338,278	7,890,405	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		19,880,000	-	
3,800,000	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**155,051,136**	115,088,978	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**3,917,634,505**	3,420,081,118	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		3,763,676,594	3,276,491,226	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		153,957,911	143,589,892	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්		-	-	
78,331,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	76,542,418	65,801,629	ඒසීඒ-2(ii)
69,985,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	53,042,340	52,716,131	ඒසීඒ-2(ii)
1,200,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	814,457	860,264	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	ඒසීඒ-2(ii)
149,516,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**130,399,215**	119,378,024	
	මූලධන වියදම්				
2,800,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	1,380,382	7,253,342	ඒසීඒ-2(ii)
23,880,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	20,350,483	6,144,224	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
3,000,000	හැකියා වර්ධනය	14	602,588	1,661,943	ඒසීඒ-2(ii)
-	වෙනත් මූලධන වියදම්	15	-	-	ඒසීඒ-2(ii)
29,680,000	**මුළු මූලධන වියදම් (උ)**		**22,333,453**	15,059,509	
	තැන්පතු ගෙවීම්		338,265	8,447,791	ඒසීඒ-4
8,000,000	අත්තිකාරම් ගෙවීම්		7,913,434	7,340,006	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	162,328	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		8,251,699	15,950,125	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		160,984,367	150,387,658	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(7,026,456)	(6,797,766)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(7,026,456)	(6,797,766)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3

1

3. 2 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	83,327,235	56,456,442
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	16,880,175	15,305,019
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**100,207,410**	**71,761,461**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		15,422,759	13,997,946
දේපළ පිරියත හා උපකරණ සංචිතය		83,327,235	56,456,442
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	1,457,416	1,307,073
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**100,207,410**	**71,761,461**

පිටු අංක **07** සිට **40** දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක **41** සිට **48** දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තගර්ත කොටස් වේ. මෙම මූල්‍ය **ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාගෙර්පදේශ** අංක **06/2024 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාතර්ාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්‍ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 2025.02. 28	දිනය : 2025.02.24	දිනය : 2025.02. 24

අයි. පී. කොතලාවල
ප්‍රධාන ගණකාධිකාරී
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
කොළඹ 01.

ටී.ටී. උපුල්මලී ප්‍රේමතිලක
ආනයන හා අපනයන පාලක ජනරාල්
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
කොළඹ 01.

2

කේ.එම්.මහින්ද සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

3.3 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
මුළු බදු ලැබීම්		3,762,583,369	3,304,992,140
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-	-
ලාභ		-	-
ආදායම් නොවන ලැබීම්		19,880,000	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		4,158,551	3,604,925
අග්‍රිම ලැබීම්		128,344,250	100,498,000
අත්තිකාරම් අයකර ගැනීම්		7,474,212	8,443,510
තැන්පතු ලැබීම්		488,608	6,700,573
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		**3,922,928,990**	**3,424,239,148**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		127,853,087	115,363,541
සහනාධාර සහ මාරුකිරීම්		814,457	860,264
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		-	330,700
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		3,763,676,594	3,276,491,226
අත්තිකාරම් ගෙවීම්		7,913,434	7,523,789
වැටුප් පාලන ගිණුමෙන්ගෙවීම		-	162,328
තැන්පතු ගෙවීම්		338,265	8,447,791
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		**3,900,595,837**	**3,409,179,639**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		**22,333,153**	**15,059,509**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
පොළී		-	-
ලාභාංශ		-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-	-
උපණය අයකර ගැනීම්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>			
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්		22,333,153	15,059,509
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		**22,333,153**	**15,059,509**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)		**(22,333,153)**	**(15,059,509)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>			
දේශීය ණය ගැනීම්		-	-
විදේශීය ණය ගැනීම්		-	-
ප්‍රදානයන් ලැබීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>			
දේශීය ණය ආපසු ගෙවීම්		-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)		-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		-	-

3

3.4 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
10.01.03.00	ආනයන හා අපනයන බලපත්‍ර සහ අතිරේක ගාස්තු	3,100,000,000/-	3,100,000,000/-	3,762,583,369/-	121.37%

3.4.1 පසුගිය වර්ෂ 4 ක ආනයන හා අපනයන පාලන බලපත්‍ර සහ අතිරේක ගාස්තුවල වටිනාකම

රු. ‘000

වර්ෂය	2021	2022	2023	2024
ශුද්ධ ආදායම	2,934,679	3,086,778	3,304,992	3,762,583



දෙපාර්තමේන්තුවේ පසුගිය වසර 3 ක බලපත්‍ර ආදායම පිළිබඳව සලකා බැලීමේදී ආදායමේ ක්‍රමික වැඩිවීමක් දක්නට ලැබේ. 2024 වර්ෂයේ බලපත්‍ර නිකුත් කිරීමෙන් රුපියල් බිලියන 3.7 ක් වැනි ඉහළ ආදායමක් ඉපයීමට සමත් වී ඇති

අතර එය 2023 වර්ෂයට සාපෙක්ෂව 13% ක පමණ වැඩි වීමකි. තවද ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි උල්ලංඝනය කරන ලද අවස්ථාවලදී අතිරේක ගාස්තු අයකිරීම ද සිදු කරන ලදී.

3.5 2024 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	143,885,000/-	149,516,000/-	130,399,215/-	87.21
ප්‍රාග්ධන	9,800,000/-	29,680,000/-	22,333,453/-	75.24

3.6 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන නොමැත.

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූලය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	68,099,235/-	-	-
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	15,228,000/-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.8 විගණකාධිපති වාර්තාව (ඇමුණුම 1)

4 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

4.1ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිතදර්ශක	අපේක්ෂිතනිමැවුම් ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	75% - 89%	50% - 74%	49% - 0%
ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම හා හර කිරීම	√			
ගැසට් ප්‍රකාශන	√			
STRATLINK පරිගණක මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීම	√			
පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	√			

5 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සාක්ෂාත් කරගැනීමේ කාර්යසාධනය

2015 වර්ෂයේ පැවැති එක්සත් ජාතීන්ගේ සමුළුවේදී ලෝක රාජ්‍ය නායකයන් විසින් ගෝලීය වශයෙන් 2030 වසරේදී ළඟා විය යුතු තිරසර සංවර්ධන අරමුණු 17 ක් සහ ඉලක්ක 169 ක් හඳුන්වා දෙන ලදී. තිරසර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රයෙහි මානවයා, මිහිකත සහ සෞභාග්‍යය වෙනුවෙන් වන්නා වූ ක්‍රියාකාරී සැලසුම්, පුළුල් නිදහස තුළ විශ්වීය සාමය ශක්තිමත් කිරීමේ වෑයම්, අන්ත දරිද්‍රතාවය ඇතුළු දිළිඳු බවෙහි ස්වරූපයන් තුරන් කිරීම, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන්, ගැහැනු ළමුන් සවිබල ගැන්වීම සාක්ෂාත් කර ගැනීම සහ සියලු පාර්ශ්වකරුවන්ගේ සහයෝගී ක්‍රියාකාරිත්වය යනාදිය ඇතුළත් කර ඇත.

ගෝලීය තිරසර සංවර්ධනයට ප්‍රවේශයක් ලෙස ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනයන් ඊට අනුගත වීම සහ දිගුකාලීන සංවර්ධන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා වූ අවශ්‍යතාවය පිළිබඳව තිරසර සංවර්ධන සභාව අනුග්‍රහයෙන් පවත්වන ලද වැඩමුළු සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී විය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ කාර්යභාරය පදනම් කරගනිමින් දෙපාර්තමේන්තුවට අදාළ ගෝලීය තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්කයන් තවදුරටත් පුළුල් කරගනිමින් හඳුනාගැනීමක් සිදුවිය. පසුව දෙපාර්තමේන්තු අභිලාෂයන් මුදුන්පත් වන පරිදි දිගුකාලීන දැක්මකින් යුතුව තිරසර සංවර්ධන අරමුණු හා එහි ප්‍රගතිය මැනීම සඳහා වූ නිර්ණායකයන් ස්ථාපිත කර ගන්නා ලදී. ස්ථාපිත කරගත් අරමුණු තුළින් රටේ තිරසර සංවර්ධනය සඳහා වූ කාලීන අවශ්‍යතාවය සැපිරීම උදෙසා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරකම් ආරම්භ කොට ඇත. දෙපාර්තමේන්තුවට අදාළව අරමුණු සකස් කර ගැනීමේදී පාදක කරගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු පහත පරිදි වේ.

5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

නගර සහ ජනාවාස පරිපූර්ණ ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම. (තිරසර සංවර්ධන අරමුණු අංක 11)

ජීවත්වීම උදෙසා හිතකර පරිසරයක් රට තුළ ගොඩනැගීම සඳහා වාතයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය සිදුකළ යුතුය. නාගරීකරණය වූ ප්‍රදේශවල රථවාහන භාවිතය ශීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් එම ප්‍රදේශයන්හි වාතයේ අඩංගු විමෝචන වායුප්‍රතිශතයේද වැඩිවීමක් දක්නට ඇත. මෙහිදී අවධානයට ලක් වූ කරුණ නම් රථවාහනවලින් පිටවන විෂ දුමාරය මඟින් සැළකිය යුතු මට්ටමක වායු දූෂණයක් සිදුවන බවයි. එබැවින් වායු විමෝචන ප්‍රමිතීන්ට අනුකූල නොවන වාහන ආනයනය කිරීම නවතා ඇත. ඒ සඳහා 2019.01.25 දිනැති අංක 2107/45 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් රෙගුලාසි පනවා ඇත.

තිරසර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවක් සහතික කිරීම. (තිරසර සංවර්ධන අරමුණු අංක 12)

පරිසර හිතකාමී ලෙස රසායනික ද්‍රව්‍ය සහ සියලුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම තුළින් මානව සෞඛ්‍යයට සහ පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමෙන් රජය අපේක්ෂා කරන සංවර්ධන ඉලක්කයන් කරා ළඟාවීමට දෙපාර්තමේන්තුව නියාමන ආයතනයක් ලෙස කටයුතු කරයි. එලෙස බලපෑම් ඇතිකරනු ලබන අයිතම හඳුනාගෙන ඒවා පාලනය හා නියාමනය කිරීම සඳහා ආනයන හා අපනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම, ආනයනය හා අපනයනය සම්පූර්ණයෙන්ම තහනම් කිරීම සහ ආනයන හා අපනයනයට අදාළ ප්‍රමිති නියම කිරීම අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් නිසියාකාරව සිදුකරනු ලබයි.

ඒ අනුව, පරිසර අමාත්‍යාංශය විසින්, 2023 ජනවාරි මස 31 දිනැති අංක 23/0265/622/003 දරන "තනි භාවිත ප්ලාස්ටික්/පොලිතීන් අපද්‍රව්‍ය පාලනය" යන මැයෙන් වූ ඔවුන්ගේ අමාත්‍ය මණ්ඩල සටහනේ දක්වා ඇති යෝජනා සඳහා ලබා ගන්නා ලද අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ප්‍රකාරව, 2023 ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ප්ලාස්ටික්වලින් නිර්මිත එක් වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් බීම බට, කැලතීමේ උපකරණ , පිඟන්, කෝප්ප (යෝගට් කෝප්ප හැර), යෝගට් හැඳි ඇතුළු හැඳි, ගෑරුප්පු, පිහි සහ ප්ලාස්ටික් මල්මාලා, ප්ලාස්ටික් ඉඳිආප්ප වට්ටි ආනයනය කිරීම කිරීම, 2023 අප්‍රේල් මස 06 දිනැති අංක 2326/41 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් තහනම් කර ඇත.

ඊට අමතරව, 2024 වර්ෂයේ දී සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 304ක් යටතේ වන ආනයනික භාණ්ඩ සඳහා ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන රෙගුලාසී පනවමින් 2024 මැයි මස 17 දිනැති 2384 / 35 අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී. මෙහිදී සෘජුවම මනුෂ්‍ය පරිභෝජනයට ගනු ලබන, ආහාර වර්ග මෙන්ම උපකරණ හා උපාංග බොහොමයක් සඳහා ප්‍රමිති තත්ත්වයන් අනිවාර්ය කර ඇත.

තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සැම මට්ටමකටම ඵලදායී, වගකීම් සහිත පූර්ණ ආයතන ගොඩනැගීම. (තිරසර සංවර්ධන අරමුණු අංක 16)

සියලුම මට්ටම්වල නිලධාරින්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමත්, එම තීරණ නිරන්තර ඇගයීමට භාජනය කිරීමෙන් ඉහළ සඵලත්වයක් තහවුරු කරගැනීමත් දෙපාර්තමේන්තුව ඉලක්ක කර ඇත. කාර්ය මණ්ඩල රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් හරහා සියලුම මට්ටම්වල නිලධාරින් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සක්‍රීයව හවුල් කරවා ගැනීමෙන් ඵලදායී වගවීමෙන් යුක්ත හා විනිවිදභාවයෙන් යුත් ආයතනයක් පවත්වා ගෙන යාමට හැකියාව ලැබී ඇත.

පවත්නා නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය පූර්ණ වශයෙන් තහවුරු වන ආකාරයට දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය පහසුකම් එකී පාර්ශ්වයන් වෙත ලබා දී ඇත. දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කරන ලද තොරතුරු ඉතා වගවීමෙන් සහ ඉතා ඉක්මනින් ඉල්ලුම් කරන පාර්ශ්වයන්ගේ අතට පත් කරනු ලබන අතර, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා ද යාවත්කාලීන තොරතුරු වෙතට පිවිසීමේ හැකියාව සලසා දී ඇත.

තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගිතාවය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවන් සවිමත් කිරීම සහ පුනර්ජීවනය (තිරසර සංවර්ධන අරමුණු අංක 17)

රජය විසින් අපේක්ෂා කරනු ලබන තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට, ගනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, පහසුකම් සැපයීම, සම්බන්ධීකරණය කිරීම හා නියාමනය කිරීම දෙපාර්තමේන්තුවේ වගකීම වේ. මේ යටතේ, රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ නියාමනය නිසියාකාරව සිදු වීම තහවුරු කිරීම, ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධයෙන් ඇති රෙගුලාසි බලගැන්වීම හා ශක්තිමත් කිරීම යන අරමුණු සුවිශේෂී වේ. එහිදී ඒක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල ප්‍රඥප්ති 1540 මෙන්ම වෙළඳ පහසුකම් සැපයීමේ ගිවිසුම (**Trade Facilitation Agreement**) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීම හා සංගතභාවය තුළින් ජගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය වැඩිදියුණු කිරීම යන තිරසාර සංවර්ධන අභිමතාර්ථ ළඟාකර ගැනීම සිදුකරනු ලබයි. 1540 යෝජනාව 2023 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කරන ලදී . ඊට සමගාමීව ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම මාර්ගගත ක්‍රමය ඔස්සේ වඩාත් වඩාත් සඵලාදායිව ඉටුකරනු වස් ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය හා සම්බන්ධව **STRATLINK** පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා **STRATLINK** පරිගණක පද්ධතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධ මූලික මට්ටමේ පුහුණු කිරීම් එස්තෝනියා රජයේ නියෝජිතයින් විසින් සිදු කරන ලදී. ඒ අනුව, 2024.10.25 දින **STRATLINK** පරිගණක පද්ධතිය නිල වශයෙන් දියත් කරන ලද අතර, ආනයන අපනයන පාලන බලපත්‍ර සහ හර පත්‍ර මාර්ගගත ක්‍රමය ඔස්සේ නිකුත් කිරීමට පියවර ගෙන ඇත.

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%- 49%	50%- 75%	76%- 100%
11. නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.	11.6 2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත්ව නගර නිසා සිදු වන ඒක පුද්ගල අහිතකර පරිසර බලපෑම අඩු කිරීම.	1.ප්‍රමිතීන්ට අනුකූල නොවන වාහන නිෂ්කාශනය කිරීමට ඉඩ නොදීම.			✓
12. තිරසර පරිභෝජන සහ නිෂ්පාදනරටාව න් සහතික කිරීම.	12.4 2020 වන විට එකඟතාවයට පත් වී ඇති අන්තර්ජාතික වැඩ සැලැස්මට අනුකූලව පරිසර හිතකාමී අන්දමට	2. බාසල් සම්මුතිය සමාලෝචනය සම්පූර්ණ කිරීම.			✓
		3. අදාළ අධිකාරියේ නිර්දේශය මත			✓

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-75%	76%-100%
	රසායනික ද්‍රව්‍ය හා සියලුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ක්‍රියාවට නැංවීම සහ එමඟින් මානව සෞඛ්‍යට සහ පරිසරයට සිදුවන්නා වූ අහිතකර බලපෑම අවම කිරීම සඳහා වාතයට, ජලයට සහ පසට ඒවා මුදා හැරීම අවම කිරීම.	පාලනය කරන ලද අයිතම ගණන.			
		4. ඇල්මක් ඇති පාර්ශ්වයන් සමග පවත්වන ලද උපදේශන රැස්වීම් ගණන.	✓		
		5. මාණ්ඩලික නිලධාරින් සමඟ පවත්වන ලද උපදේශන රැස්වීම් ගණන.		✓	
		6. දැනුවත් කිරීම් සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් ගණන.	✓		
	12.5 2030 වන විට අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළක්වීම, අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ ඒවා නැවත භාවිතා කිරීම මඟින් අඩු කිරීම.	7. විද්‍යුත් අපද්‍රව්‍ය ආනයනය අඩු කිරීම සඳහා වර්ෂය තුළ නිකුත් කරන ලද රෙගුලාසි ගණන.	✓		
		8. ප්‍රතික්ෂේප කරන ලද ආනයනික භාවිතා කළ ඉලෙක්ට්‍රොනික අයිතම ගණන (ජංගම දුරකථන, පරිගණක ආදිය).			✓
16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට	16.7 සියලුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක, සියලු දෙනා අන්තර්ගතවූ, සහභාගීත්වයෙන් යුත් සහ නියෝජනයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම.	9. පවත්වන ලද කාර්ය මණ්ඩල රැස්වීම් ගණන.		✓	
		10. පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන.		✓	

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-75%	76%-100%
අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.					
	16.10 ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම.	11. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ කළ ඉල්ලීම් මත දින 14 ක් තුළ ලබාදුන් පිළිතුරුගණන.			✓
		12.තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අනුව දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ වරින් වර පළ කරන ලද වාර්තා, සංඛ්‍යාලේඛන සහ ප්‍රකාශන ගණන.	✓		
17. තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගිතාවය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවන් සවිමත් කිරීම සහ පුනර්ජීවනය	17.1. බදු සහ වෙනත් ආදායම් එක්රැස් කිරීම වර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අන්තර්ජාතික සහයෝගය ලබා දීම ඇතුළුව දේශීය සම්පත් සජීවීකරණය.	එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා (UNSCR) 1540 ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම.		✓	
	17.16. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ද ඇතුළුව සියලුම රටවලට තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා විවිධ පාර්ශ්වයන්ගේ හවුල්කාරිත්වයෙන් දැනුම, පළපුරුද්ද, තාක්ෂණය සහ මූල්‍ය සම්පත් සජීවීකරණය සහ බෙදා ගැනීම ඔස්සේ	STRATLINK පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීම			✓

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-75%	76%-100%
	තිරසර සංවර්ධනය සඳහා වූ ජගත් හවුල්කාරිත්වය වැඩි දියුණු කිරීම.				

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට දෙපාර්තමේන්තුව වෙත ඇති කාර්යභාරය ඉටු කිරීමේදී වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් කටයුතු කිරීමට සිදුවේ. එහිදී, යම් යම් කාර්යයන් එම රාජ්‍ය ආයතනවලට පැවරෙන අතර, එම කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය දෙපාර්තමේන්තුවේ ඉලක්ක සැපිරීම කෙරෙහි තීරණාත්මකව බලපානු ලබයි. එම රාජ්‍ය ආයතන, එකී කාර්යයන් ඉටු කිරීම කෙරෙහි දක්වන ප්‍රගතිය අප දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර කරුණක් වන අතර, එය මුහුණ දීමට සිදුව ඇති තවත් අභියෝගයකි. දෙපාර්තමේන්තුව මහත් පරිශ්‍රමයක් දරමින් මෙම අභියෝගයන් ජයගැනීමට කටයුතු කරමින් සිටියි.

පසුගිය කාලය තුළ ඇති වූ ආර්ථික අර්බුදය සහ විදේශ සංචිත ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා පනවා තිබූ ආනයන අපනයන පාලන සීමාවන් ක්‍රම ක්‍රමයෙන් මේ වන විට ඉවත් කරමින් පවතී. යම් මට්ටමකට ජාතික ආර්ථිකය යහපත් අතට හැරී ඇති අතර, විදේශ සංචිත ප්‍රමාණයේ යම් වර්ධනයක් දක්නට ලැබේ. ඒ මත පදනම්ව ජන ජීවිතය වඩාත් පහසු කරවීම උදෙසා ආනයන අපනයන පාලන සීමා බොහෝ දුරට ඉවත් කරනු ලැබීය. රථවාහන ආනයනයේ සමහර කොටස් හැරුණු විට අනෙකුත් ආනයන නිදහස් කිරීම තුළින් පරිභෝජන රටාවන්හි යම් ලිහිල් වීමක් දක්නට ලැබුණු අතර, කර්මාන්ත අංශයේ වර්ධනයක් ඇති වීමට ද එය හේතු විය.

6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ආනයන හා අපනයන නියාමනයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, බලපත්‍ර නිකුත් කිරීම/ හර කිරීම සහ ආදායම් එක් රැස් කිරීම යන කාර්යයන් ඉටු කිරීම සඳහා තම සක්‍රීය දායකත්වය ලබා දෙන අතර, වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සේවාලාභීන් වෙත සැපයීම සඳහා වගවීමෙන් හා කැපවීමෙන් යුතුව කටයුතු කරයි. දෙපාර්තමේන්තුවේ 2024.12.31 දිනට සේවක සංඛ්‍යා විස්තරය පහත පරිදි වේ.

තනතුර, සේවය හා ශ්‍රේණිය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ මට්ටම	14	12	02	00
තෘතීය මට්ටම	04	04	00	00
ද්විතීය මට්ටම	84	76	09	01
ප්‍රාථමික මට්ටම	20	17	03	00
එකතුව	**122**	**109**	**14**	**01**

6.2 දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

දෙපාර්තමේන්තුවේ පවත්නා සේවක පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ඉල්ලීම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ද, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද දන්වා ඇත. තවද මානව සම්පත් හිඟය පූර්ණය කිරීම සඳහා පහත පරිදි ක්‍රියා මාර්ග ගන්නා ලදී.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුර දරන නිලධාරිණිය රා.ප.ච. 14/2022 යටතේ වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගෙන ඇති බැවින්, දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශයේ කටයුතු සඳහා යම් ඍණාත්මක බලපෑමක් ඇති වුවත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුර දරන අයට තාක්ෂණ නිලධාරි තනතුරෙහි පූර්ණ කාලීනව වැඩ බැලීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉල්ලා ඇත.
- නීති නිලධාරි පුරප්පාඩුව සඳහා පුරප්පාඩුව සම්පූර්ණ කර ගන්නා ලදී.
- පුරප්පාඩුව පැවති රියදුරු තනතුරු 03න් එක් අයකු සේවය අතහැර ගොස් ඇති අතර තවත් අයකු ස්ථාන මාරු ලබා ගෙන පැමිණ ඇත. එක් රියදුරෙකු අවිධිමත්ව සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් සේවය අතහැර යාමේ නියෝගයට ලක්ව ඇත. මේ පිළිබඳව මුදල් අමාත්‍යාංශය දැනුවත් කර ඇත. රියදුරු පුරප්පාඩුව හේතුවෙන් කාර්යාලයේ ප්‍රවාහන කටයුතු නිසි පරිදි ඉටු කර ගැනීමට නොහැකි වී ඇත.

පුරප්පාඩු තනතුරු වලින් වැඩි ප්‍රතිශතයක් සම්පූර්ණ කර ගැනීමට හැකි වූ බැවින් හා මනා මානව සම්පත් කළමණාකරණය නිසා 2024 වර්ෂයේ දෙපාර්තමේන්තු කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට ළඟා වීමට හැකි වි ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

2024 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය හා ඍජුව බැඳෙන පහත සඳහන් කර ඇති වැඩසටහන්/පාඨමාලා සඳහා සේවකයන් යොමු කරවන ලදී .

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
සංවර්ධනය වෙමින් පවතින රටවලට ජාත්‍යන්තර වෙළඳ බාධකවලට මුහුණ දීම පිළිබඳ AIBO 0228-0312 සම්මන්ත්‍රණය.	01	2024.02.28 සිට 2024.03.12 දක්වා	-	ඇමෙරිකානු ඩොලර් 375 + පවුම් 75	විදේශීය	ජාත්‍යන්තර වෙළඳ රේගු ක්‍රියා පටිපාටිය සහ ලෝක වෙළෙඳ සංවිධානයේ ක්‍රියා පටිපාටිය පිළිබඳ දැනුමක් ලබා ඇති අතර, එය දෙපාර්තමේන්තු රාජකාරි සක්‍රීය කිරීම සඳහා යොදා ගැනීම.

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
උපායමාර්ගික වෙළඳ කළමනාකරණ පුහුණු වැඩසටහන.	01	2024.05.13 සිට 2024.05.24 දක්වා	-	ඇමෙරිකානු ඩොලර් 375 + පවුම් 75	විදේශීය	යුරෝපීය සංගමයේ ද්විත්ව භාවිත ලැයිස්තුව සහ යුද උපකරණ ලැයිස්තුව නියාමනය කිරීම. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1540 හි උපායමාර්ගික වෙළඳ කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුළුල් දැනුම දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු සඳහා යොදා ගැනීම.
ඩිජිටල් යුගයේ පාලනය - ඕස්ට්‍රේලියා ප්‍රදාන කෙටි පාඨමාලාව.	01	2024.06.24 සිට 2024.07.05 දක්වා	-	ඇමෙරිකානු ඩොලර් 375	විදේශීය	ඩිජිටල් යුගයේ රාජ්‍ය තන්ත්‍රය කෙසේ විය යුතුද යන්න පිළිබඳ අවබෝධය.
පිලිපීන උපායමාර්ගික වෙළඳ කළමනාකරණය PHTSTM සමුළුව 2024.	01	2024.09.08 සිට 2024.09.13 දක්වා	-	ඇමෙරිකානු ඩොලර් 150	විදේශීය	පිලිපීනයේ පැවති අපනයන පාලනය සහ අදාළ දේශසීමා ආරක්ෂක වැඩසටහන (Export Control and Related Border Security Program, EXBS) සමඟ ද්විපාර්ශ්වික රැස්වීමක් පවත්වා උපායමාර්ගික වෙළඳ පාලන සහ Stratlink බලපත්‍ර නිකුත් කිරීමේ මාර්ගගත පද්ධතියේ සංවර්ධනය පිළිබඳ ප්‍රගතිය දැනුම් දීම. උපායමාර්ගික වෙළඳ කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකාව නියැදියක් ලෙස යොදා

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහ නේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
						ගැනීමට එක්සත් ජාතීන් ගේ නියෝජිතයන් මෙහිදී එකඟ විය.
තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ වැඩසටහන.	28	පැය 01	-	-	දේශීය	තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සම්බන්ධයෙන් අවබෝධයක් ලබා දීම.
ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ක්‍රියාපටිපාටිය සම්බන්ධ වැඩසටහන.	27	පැය 01 ½	-	-	දේශීය	ඖෂධ සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමේ දී, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ක්‍රියාපටිපාටින් පිළිබඳව දැනුම්වත් වීම.
රේගු සටහන්කරය පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන.	32	පැය 2	-	-	දේශීය	රේගු සටහන්කරය පිළිබඳ අවබෝධයක් ලබා දීම.
ශ්‍රී ලංකා ප්‍රමිතිකරණය පිළිබඳ වැඩසටහන.	23	පැය 2	-	-	දේශීය	ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන ප්‍රමිතිකරණ, සම්බන්ධයෙන් දැනුම්වත් වීම.
මුදල් විශුද්ධිකරණය පිළිබඳ වැඩසටහන.	30	පැය 02	-	-	දේශීය	අපරාධ ක්‍රියාකාරකම්වලින් උපයා ගන්නා මුදල් පැහැදිළිවම නීතිමය මුලාශ්‍රයක් සහිත අරමුදල් බවට පරිවර්තනය කිරීම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන.	22	පැය 02	-	-	දේශීය	තොරතුරු තාක්ෂණය, දෘඩාංග සහ මෘදුකාංග පිළිබඳ දැනුම.
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන.	23	පැය 02	-	-	දේශීය	රජයේ ප්‍රසම්පාදනය ක්‍රියාවලිය පිළිබඳ දැනුම.

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
ජාතික කම්කරු අධ්‍යයන ආයතනය විසින් කාර්යාල සේවක සේවය/ රියදුරු සේවයේ නිලධරයන් සඳහා ගුණාත්මක කාර්යාල වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ වැඩසටහන.	04	දින 01	රු. 20,000	-	දේශීය	ගුණාත්මක වැඩ පරිසරයක් නිර්මාණය කිරීමට කාර්යාල කාර්ය සහයකයින් සහ රියදුරන්ගෙන් ඉටුවිය යුතු කාර්යභාරය පිළිබඳ දැනුම්වත්වීම.
සංයෝජිත වර්ගීකරණ සංකේතාංක පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන	39	පැය 02	-	-	දේශීය	සංයෝජිත වර්ගීකරණ සංකේතාංක පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
විගණන විමසුම් පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන.	50	පැය 02	-	-	දේශීය	විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම, විගණන විමසුම්වල වැදගත්කම හා විගණන පනත සම්බන්ධව දැනම්වත්වීම.
රජයේ වැටුප් සැකසීමේ ක්‍රියාවලිය සම්බන්ධ පුහුණුව.	01	දින 03	රු. 18,000	-	දේශීය	රජයේ වැටුප් සැකීමේ ක්‍රියාවලිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.
ප්‍රථමාධාර පුහුණුව.	01	පැය 03	රු. 4235.90	-	දේශීය	හදිසි අවස්ථාවක දී වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
වරායට පැමිණෙන නැව් සඳහා , ඉන්ධන ලබාදීමේ පටිපාටිය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන.	53	පැය 02	-	-	දේශීය	වරායට පැමිණෙන නැව් සඳහා ඉන්ධන ලබා දීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
ආනයන හා අපනයන පාලන රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම සඳහා නිකුත් කරනු ලබන අතිවිශේෂ ගැසට්පත්‍රයන් ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය	33	පැය 02	-	-	දේශීය	ගැසට් පත්‍රයන් ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ න්‍යායාත්මක දැනුම.

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම්/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
සම්බන්ධ න්‍යායාත්මක පුහුණු වැඩසටහන.						
ආනයන අපනයන සම්බන්ධ වරාය අධිකාරියේ කාර්ය භාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන.	49	පැය 04	-	-	දේශීය	ආනයනයට හා අපනයනයට අදාළව වරාය අධිකාරියේ කාර්ය භාරය පිළිබඳ දැනුම.
රජයේ වාහන නඩත්තු කිරීමේ ක්‍රියාපටිපාටිය සම්බන්ධ දැනුම්වත් කිරීමේ වැඩසටහන.	01	දින 01	රු. 5000.00	-	දේශීය	රජයේ වාහන නඩත්තුව සම්බන්ධයෙන් දැනුම්වත්භාවය ලබා ගැනීම.
වැටුප් පරිවර්තනය සිදු කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන.	01	දින 02	රු. 13,000.00	-	දේශීය	වැටුප් පරිවර්තනය පිළිබඳ දැනුම.
ගිනි ආරක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන.	02	දින 04	රු. 8,471.79	-	දේශීය	හදිසි ගිනි ගැනීමකදී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ අවබෝධය.
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පුහුණුව.	02	දින 03	රු. 36,000.00	-	දේශීය	එදිනෙදා කාර්යාලීය කටයුතු ඉටු කිරීමේ දී ඉංග්‍රීසි භාෂාව භාවිත කිරීම පිළිබඳ දැනුම.
මොන්ට්‍රියල් සම්මුතිය හා පාලන යාන්ත්‍රණය සම්බන්ධව දැනුම්වත් කිරීම. සහ නිලධාරීන්ගේ ආකල්ප හා ධනාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීම් වැඩිදියුණු කිරීමේ පුහුණු වැඩසටහන.	71	දින 01	-	-	දේශීය	• ඕසෝන් ස්ථරය සුරැකීමේ වැදගත්කම. සහ • යහපත් ආකල්පවලින් කටයුතු කරන නිලධාරීන් පිරිසක් බවට පත් කිරීම.
1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත සම්බන්ධයෙන් දැනුම්වත්	17	පැය 02	-	-	දේශීය	1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ වගන්ති

වැඩසටහන හෝ පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය හා විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
කිරීමේ පුහුණු වැඩසටහන.						සම්බන්ධයෙන් දැනුම්වත් කිරීම.
කාර්යාල ක්‍රම සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහන.	22	පැය 2	-	-	දේශීය	කාර්යාල ක්‍රම සම්බන්ධව දැනුම්වත් කිරීම.

7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරිම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	-		
02	පොත්පත් හා ලේඛන නඩත්තු කිරිම් (මු.රෙ. 445)			
2.1	රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛනය / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරිම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිනඩි මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරිම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරිම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරිම	අනුකූල වේ		
05	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබිම.	අනුකූල නොවේ	විවිධ අංශවලින් පිළිතුරු ලබා ගැනීමේ දී ප්‍රමාදයන් සිදුවීම	ප්‍රමාදවීම්වලින් තොරව ඉදිරියේ දී පිළිතුරු ලබා දෙන ලෙසට නිලධාරීන් දැනුවත් කරන ලදී.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2)DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මු.රෙ. 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණකමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති චක්‍රලේඛ අංක 2016/30දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3:1ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු ගිණුම් සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරිම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	රජයේ නිලධාරීන්ගේ අත්තකාරම් ගිණුම්			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	සේවය අත්හිටවූ සහ තනතුර අතහැර ගියාසේ සලකන ලද නිලධාරීන්ගේ ණය ශේෂ පැවතීම	ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවති.
13	පොදු තැන්පත් ගිණුම්			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම්			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	ආදායම් අග්‍රිම			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරිම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්. තැන්පත් ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳව මහජනතාවගේ ප්‍රශංසා / චෝදනා පළ කිරිමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරිම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛනයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරිම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ අමුණුම් 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	2023.11.30 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 (1) ප්‍රකාරව අදාළ නොවේ.		
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

සමාප්ති සටහන

පසුගිය වර්ෂවල මුහුණ දුන් ආර්ථික අර්බුදකාරි තත්ත්වය ක්‍රමිකව යහපත් තත්ත්වයකට පැමිණීම මත, බහුතරයක් වූ ආනයන සීමා අදියර කිහිපයක් යටතේ ඉවත් කිරීමට කටයුතු කිරීම මෙන්ම, මහජන සෞඛ්‍ය සහ පරිසරය ආරක්ෂා කිරීම ආශ්‍රිත ගැටලු ඉහළ යෑම සැලකිල්ලට ගනිමින්, ආරක්ෂිත සහ ඵලදායී වෙළඳ ප්‍රවාහයන්ට පහසුකම් සැලසීමට ප්‍රමිති සහ තත්ත්ව පරාමිතීන් යාවත්කාලීන කිරීම සහ නව තත්ත්ව ප්‍රමිතීන් හඳුන්වා අදාළ රෙගුලාසි සම්පාදනයකර ප්‍රකාශයට පත් කිරීම කටයුතු දෙපාර්තමේන්තුව විසින් ස්වකීය කර්තව්‍යය නොපිරිහෙළා ඉටු කරන ලදී.

දෙපාර්තමේන්තුවේ, විසින් ස්වකීය දැක්ම හා මෙහෙවර ඉදිරියට ගෙනයමින්, තිරසර සංවර්ධනය වූ ගෝලීය සහයෝගීතාවය ක්‍රියාත්මක කිරීමේ අරමුණ පෙරදැරිව, මෙම දෙපාර්තමේන්තුවේ පවත්නා සේවාවන් සේවා ලාභීන් වෙත, සඵලදායී ලෙස ඉටු කරන වස් , STRATLINK පරිගණක මෘදුකාංග පද්ධතිය 2024 වර්ෂයේ දී සේවාලාභීන් වෙත දියත් කිරිමට හැකිවීම, දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය අත්පත් කර ගන්නා ලද සුවිශේෂි කාර්යසාධනයකි.

නිසි දැක්මක් මත නිසි මෙහෙවරකට අනුගත වෙමින් රාජ්‍ය යාන්ත්‍රණයට සහයෝගය දක්වමින් මහජනතාව වෙත ප්‍රශස්ත සේවාවක් ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතුව කටයුතු කරන ලදී.

තවද, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ස්වකීය රාජකාරිය අනලස්ව උද්යෝගීව ඉටුකරනු පිණිසත් ඔවුන්ගේ දැනුම හා කුසලතාවයන් තවදුරටත් වර්ධනය කරලනු පිණිසත්, සුබසාධක සංගමයේ ද සෘජු දායකත්වය හා මෙහෙයවීම ලබා ගනිමින් මෙම වර්ෂයේ දී විවිධ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදී.

ඇමුණුම 1 இணைப்பு Annexure 1

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } PUR/B/IECD/2024/FS/01	ඔබේ අංකය / உமது இல. / Your No. }	දිනය / திகதி / Date } 2025 මැයි 29 දින

ආනයන හා අපනයන පාලක ජනරාල්

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් නොවන ලැබීම්

2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 හි 7.7 උපවගන්තිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී මුදල් හා හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන සෘජු ක්‍රමය භාවිත කරමින් පිළියෙලකල යුතු වුවද, විද්‍යුත් බලපත්‍ර නිකුත් කිරීමේ වැඩසටහන සඳහා එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ක්‍රියාත්මකවන EXBS වැඩසටහන යටතේ ප්‍රදානයක් ලෙස ලබා දී තිබූ එකතු වටිනාකම රු.19,880,000ක ලැප් ටොප් (Lap Top) පරිගණක 20ක හා මෘදුකාංගවල වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ආදායම් නොවන ලැබීමක් ලෙසද, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීමේ වියදමක් ලෙසද දක්වා තිබුණි.

1.6.2 මූලධන වියදම්

කිසියම් නිශ්චිත ව්‍යාපෘතියක සෘජුවම ප්‍රයෝජනයට ගැනීම සඳහා ද්‍රව්‍ය හා උපකරණ වශයෙන් විදේශ ප්‍රාග්ධන ආධාර ලැබූ කල්හි එම අයිතමයන්ට අදාළ ලිපි ලේඛනවල තොරතුරු පදනම් කරගෙන එකී ප්‍රදානයේ රුපියල් වටිනාකම දෙපාර්තමේන්තුව විසින් නිශ්චය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලයේ EXBS වැඩසටහන මඟින් ප්‍රදානයක් වශයෙන් ලැබී තිබුණු ඇ.එ.ඩො.62,303.86ක් වටිනා පරිගණක 60, තොග ලේඛනවල සටහන් කර තිබුනද එම පරිගණකවල වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේදී ආදායම් සංකේත අංක 1001-03-00 බලපත්‍ර ආදායම් සඳහා මූලික ඇස්තමේන්තුව රු.2,900,000,000 ක් වූ අතර පසුව එනම් 2024 ජූලි 30 දින මූලික ඇස්තමේන්තුව සියයට 6.89කින් පමණ එනම් රු.3,100,000,000දක්වා වැඩිකර තිබුණි.එහෙත් සමාලෝචිත වර්ෂයේදී එකී සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව ද ඉක්මවා එනම් රු3,762,582,369ක බලපත්‍ර ආදායමක් උපයා තිබූ අතර ඒ අනුව සත්‍ය ආදායම, මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සමග සැසදිමේදී පිළිවෙලින් සියයට 30ක හා 21ක විචලතාවයක් නිරීක්ෂණය විය. ඒ අනුව ආදායම් ඇස්තමේන්තු සකස් කිරිමේදී හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු පුරෝකථනය කිරිමේ අවශ්‍යතාව විගණනයේ දී නිරීක්ෂණය කෙරේ.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 135 හි 4 වගන්තියෙහි සඳහන් ආකාරයට බලතල පවරා දෙනු ලැබ ඇති නිලධාරින්ගේ වගකීම්වල ස්වභාවය පිළිබඳ ඉදිරියේදී සැකයක් ඇති නොවිය හැකි පරිද්දෙන් බලතල පවරාදීම්වල විෂය සීමාව ලිඛිතව නියමකොට දැක්විම වැදගත්වන අතර මු.රෙ.135 හි 5වන වගන්තියෙහි දක්වා ඇති අවස්ථා හෝ කාර්යයන් වෙන් වෙන් වශයෙන් සඳහන්කර දැක්විම හා එම වගන්තියේ (ආ) ප්‍රකාරව ආදායම තක්සේරු කිරිම, එකතු කිරිම, ප්‍රතිග්‍රහණය අනුව සිදුකල යුතු වුවද ආදායම සම්බන්ධ බලතල පවරාදීමක් ඉහත ක්ෂේත්‍ර යටතේ සිදුකර නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය කෙරේ.

(ඇ) මුදල් රෙගුලාසි 143(1) ප්‍රකාරව ආදායම් තක්සේරු කරන නිලධාරියා විසින් තම කාර්යභාරය ඉටු කිරීම සිදු කර තිබේද යන්න හඳුනා ගැනීමට මු.රෙ.135 ප්‍රකාරව ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය බලතල පැවැරක් සිදුකර නොතිබුණි.

3.2 වියදම් කළමනාකරණය

3.2.1 පුනරාවර්තන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම්හි වැය විෂයන් 16 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 සිට 100 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් විය.

(ආ) වැය විෂය 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් හා වැය විෂය 1101 දේශීය ගමන් වියදම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් පිලිවෙලින් සියයට 65ක් හා සියයට 76 ඉතිරි වීමට හේතු වශයෙන් දක්වා තිබුනේ නිල වාහන හිමි නිලධාරීන් 5 දෙනෙක්ගෙන් හතරදෙනෙකු වාහන දීමනාව ලබා ගැනීම හා වාහන දීමනාව ලබා නොගන්නා නිලධාරියාගේ රියදුරු අතිකාල ඉල්ලුම් නොකිරිම හා සංචිත රියදුරන්ගේ අතිකාල මනා පාලනයකින් යුතුව සිදුකිරිම යන්නයි. නමුත් 2024 අයවැය ඇස්තමේන්තුව සකස් කරන අවස්ථාව වන විට නිල වාහන හිමි නිලධාරීන් 5 දෙනෙක්ගෙන් හතරදෙනෙකු වාහන දීමනාව ගන්නා බව හඳුනාගෙන තිබු තත්වයක් තුල ප්‍රතිපාදන වෙන් කිරිමේ දි ඒ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) වැය විෂය 1201 ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් සියයට 49ක් ඉතිරි වීමට හේතු වශයෙන් දක්වා තිබුනේ පවතින මුද්‍රණ යන්ත්‍ර ඒකාබද්ධ කරමින් මුද්‍රණ පිටපත් ලබාගත හැකි නව මුද්‍රණ යන්ත්‍ර සේවා කුලී පදනම මත ලබාගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම තුලින් වියදම් සීමා කිරිමට හැකි වීම වශයෙනි. 2023 වර්ෂයේ දී මෙම වැය විෂය යටතේ රු.10,000,000 වෙන් කර මු.රෙ.66/69 මාරු කිරිම් යටතේ රු.2,242,000ක් ප්‍රතිපාදන ඉවත්කර තිබු අතර, 2024 වර්ෂයේදීද රු.10,500,000ක ප්‍රතිපාදන වෙන් කර මු.රෙ.66/69 මාරු කිරිම් යටතේ රු.2,500,000ක ප්‍රතිපාදන ඉවත්කර ඇති බව නිරීක්ෂණය විය.ඒ අනුව සමාලෝචිත වර්ෂයට පෙර වසරේදීද මේ ආකාරයට ප්‍රතිපාදන ඉතිරිවී ඇති හෙයින් හැකිතාක් නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරිමේ අවශ්‍යතාවය විගණනයේ දි නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයන් 4ක ඇස්තමේන්තු හා සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර සියයට 15 සිට සියයට 65 ක් දක්වා වූ පරාසයක විචල්‍යතාවයක් විය. ඒ අනුව මුලික ඇස්තමේන්තු සකස් කිරිමේදි පසුගිය වර්ෂයන්හි වියදම් පිළිබඳ සමාලෝචනයක් සිදු කර හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පුරෝකථනය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී අවධාරණය කෙරේ.

3.2.2 මූලධන වියදම්

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලධන වැය විෂයයන් 04 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 32 සිට සියයට 88 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් විය.ඒ අනුව මුලික ඇස්තමේන්තු සකස් කිරිමේ දී හැකිතාක් නිවැරදිව වියදම් පුරෝකථනය කිරිමට කටයුතුකර නොතිබුණි.

3.2.3 අත්තිකාරම් ගිණුම්

සේවය හැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු වර්ෂ 1 සිට 3දක්වා පැරණි ණය ශේෂය රු.458,816ක් ද, අවුරුදු 1ට අඩු 182,692ක ණය ශේෂයක්ද විය.තවද වැඩ තහනම්කළ නිලධාරින්ගේ ණය ශේෂය ලෙස වර්ෂ 5ට වඩා පැරණි 335,753ක ශේෂයක් ද , වර්ෂ 1සිට 3දක්වා පැරණි රු.238,000ක ණය ශේෂයක් ද විය.ඒ අනුව ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති අනුව එම ණය අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

3.2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසි වලට යොමුව		අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i)	මු.රෙ.371(2)	යොමුගත වගන්ති ප්‍රකාරව අතුරු අග්‍රිම ලබා දීම මාණ්ඩලික නිලධාරින්ට පමණක් සීමා විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදි ගොඩනැගිලි කුලී අත්තිකාරම් ලෙස ගොඩනැගිලි හිමිකරු වෙත ලබා දී තිබූ රු.100,000ක අත්තිකාරම තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලෙස ලබා දී තිබුණි.
(ii)	මු.රෙ.891	නියමිත පරිදි යාවත්කාලීන කරමින් රජයේ නිලධාරින් සඳහා වූ ඇප ලේඛණයක් පවත්වාගත යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් ඇප ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි.
(iii)	මු.රෙ.892	ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන්ට අදාල ප්‍රතිශෝධන ලැයිස්තුවක් සකස්කර නොතිබුණු අතර ඇප තැබීමට අවශ්‍ය සියළුම නිලධාරීන්ගේ සංශෝධිත වාර්තාවක්, සෑම වර්ෂ තුනක අවසානයේ දී අවසාන වාර්තාව ඉදිරිපත් කිරිමට නියමිතව තිබූ තුන්වැනි ලිත් වර්ෂය දක්වා වූ කාලය සඳහා පොදු 183 ආකෘතියෙහි පිළියෙල කළ යුතුය. මෙම වාර්තාව තවදුරටත් ඇප

		තැබීමට අවශ්‍ය නොවන නිලධාරින්ගේ නම් ද, ඇප ලිපි ලේඛණවල ලියාපදිංචි අංකය හා දිනය ද, ඇප නවතාලීමට ඇති හේතු ද දැක්වෙන වෙනම වාර්තාවක්, ඉහත සඳහන් කර ඇති තුන්වැනි ලිත් වර්ෂය අවසානයට පසුව යෙදෙන පෙබරවාරි 15 වැනි දිනට පෙර අදාල අමාත්‍යංශයේ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද එසේ ඉදිරිපත් කර නොතිබුණි.
(iv)	මු.රෙ.893	රජයේ නිලධාරියෙකු ඇප තබා ඇති තනතුරක් දැරීම අවසන් වුවහොත්, ඔහුගේ ඇපය හැකි ඉක්මණින් නිදහස් කිරීම සඳහා වහා ක්‍රියා කළ යුතු වුවද නිලධාරින් දෙදෙනෙකුට අදාලව එකතු වටිනාකම රු.10,000ක ඇපයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.
(v)	මු.රෙ.1646	වාහනවල දෛනික ධාවන සටහන් එම මාසයට අදාලව ඊලග මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද දෙපාර්තමේන්තුව සතු වාහන 02ක සමාලෝචිත වර්ෂයේම හා තවත් වාහන 2ක නොවැම්බර්,දෙසැම්බර් මාසවලට අදාලව දෛනික ධාවන සටහන් නිසි පරිදි ඉදිරිපත් කර නොතිබුණි.
	2016 අගෝස්තු 3 දිනැති අංක 250/2016(i) දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ	කල්බදු පදනම මත ලබාගෙන තිබූ ගොඩනැගිල්ලට අදාලව අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු.100,000ක මුදල චක්‍රලේඛණයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

1969 ජනවාරි 16 දිනැති අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතින් පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වුවත් එක් එක් විෂයයන්ට අදාලව රජයේ ආයතන විසින් නිකුත් කරනු ලබන නිර්දේශ මත පදනම්ව පමණක් ආනයන බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. තවද, දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කිරීම සඳහා පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් හෝ ක්‍රියාපටිපාටියක් සකස් කර නොතිබුණු අතර බලපත්‍ර ගාස්තු අයකිරීම ප්‍රධාන කාර්යය ලෙස සළකා කටයුතු කරමින් රටෙහි සමස්ථ පාරිභෝජනයෙහි පුරෝකථනයන් සිදු කර ප්‍රමාණ පාලනය (Quantity Control) නොකරන බව නිරීක්ෂණය විය.

4.1.2 සැලසුම් කිරීම

2024 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රසම්පාදන කටයුතු සම්පාදනය සඳහා රුපියල් මිලියන 23,633 ක් වෙන්කර තිබුණු අතර සත්‍ය වශයෙන්ම වර්ෂය තුල දරා තිබුණු වියදම රුපියල් මිලියන 9,955 ක් විය. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට යෝජිත අරමුණු ඉටු කර ගැනීමේ මුල්‍ය ප්‍රගතිය සියයට 42 ක් වී තිබුණි.

4.1.3 දෙපාර්තමේන්තුවේ වගකීම් හා කාර්ය භාරය

අපනයන පාලනයට අදාළ රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කිරීම සහ එකී රෙගුලාසි වලට යටත්ව මෙරට ආර්ථිකයේ යහපත උදෙසා බලපත්‍ර නිකුත් කිරීම ද දෙපාර්තමේන්තුවේ වගකීම් සහ කාර්ය භාරයන් වශයෙන් දැක්වුවද දෙපාර්තමේන්තුව ආනයන පාලනයට අදාළ කාර්යයන්හි පමණක් නිරතවී තිබුණු අතර අපනයනයන්ට අදාළ කිසිදු රෙගුලාසියක් නිකුත් කළ බවට විගණනයට නිරීක්ෂණය නොවුණි.

4.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 අනුව සහ 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු

ලැබ ඇති හෝ නිලධාරීන් ද රජයේ ගිණුමට අදාළ චවුචර සහතික කරන, චෙක්පත් අත්සන් කරන අයද, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටුකරන බවට ඇප තැබිය යුතු වුව ද, එපරිදි ඇප තැබිය යුතු නිලධාරීන් තිදෙනෙකු විසින් 2024 දෙසැම්බර් 31 වන විටත් නියමිත පරිදි ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.

4.3 කළමනාකරණ දුර්වලතා

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව කුලී පදනම මත ලබා ගෙන ඇති ගොඩනැගිල්ලේ බිම් මහලේ පිහිටි කාර්යාල පරිශ්‍රය තුල නිර්දේශිත ගුණාත්මක වායු මට්ටමක් නොමැති බව අවස්ථා 02කදී සිදු කර තිබූ ඔක්සිජන් පරීක්ෂාවේදී අනාවරණය වී තිබුණද එම තත්වය නිවැරදි කිරීම සඳහා ගොඩනැගිලි හිමිකරු කටයුතු කර නොතිබුණු අතර මෙම පරීක්ෂාව සඳහා රු.67,586ක මුදලක් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට දැරීමට සිදු වී තිබුණු බවද නිරීක්ෂණය විය.

5 යහපාලනය

5.1 රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීම

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2021 හා 2022 මුදල් වර්ෂවල විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධන නිරීක්ෂණවලට අදාලව 2024 ජනවාරි 23 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී ලබා දුන් පහත සඳහන් නියෝග මෙම වාර්තාවෙ දිනය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(අ) ආනයන බලපත්‍රවල ඇතුලත් කොන්දේසි කඩකරනු ලබන ආනයනකරුවන් ප්‍රසිද්ධ කිරීමට අමතරව ඔවුනට දඩුවම් ලබා දීම සඳහා ක්‍රමවේදයක් සකස්කර ක්‍රියාත්මක කරන ලෙස, ලබා දී තිබූ නියෝගය ඉටුකර නොතිබුණි.

(ආ) ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලනයට යටත්වන භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංක (HS Codes) යටතේ ආනයන කරනු ලබන භාණ්ඩ අධීක්ෂණය කිරීම හා ආනයන පාලනයට යටත් විය යුතු අනෙකුත් භාණ්ඩ සම්බන්ධයෙන් ද සොයා බලා සුදුසු භාණ්ඩ සංයෝජිත වර්ගීකරණ අංක යටතේ ආනයන පාලනයට යටත් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයනය කර තිබූ වාහනවල අයිතිය මාරු කිරීමේ දී යම් අක්‍රමිකතාවක් සිදුව තිබේද යන්න මෝටර්රථ ප්‍රවාහන දෙපාර්ථමේන්තුව සමඟ සම්බන්ධ වී පරීක්ෂා කරන ලෙස ලබා දී තිබූ නියෝගය ප්‍රකාරව අදාල පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි.

6 මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

2024 දෙසැම්බර් 31 දිනට අනුමත, තත්‍ය සහ පුරප්පාඩු කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	14	12	2	-
තෘතියික මට්ටම	4	4	-	-
ද්විතික මට්ටම	84	76	9	1
ප්‍රාථමික මට්ටම	20	17	3	-
එකතුව	122	109	14	1

(අ) දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 122 වන නමුත් තත්‍ය කාර්යය මණ්ඩලය 109 ක් ව පැවති අතර එදිනට නියෝජ්‍ය/සහකාර පාලන තනතුරට සහ නීති නිලධාරී තනතුරට අදාළව පුරප්පාඩු 1ක බැගින් පැවති අතර නීති නිලධාරී පූරප්පාඩුවට අදාලව නීති නිලධාරියෙකු 2025 ජනවාරි මස බඳවාගෙන තිබුණි. ද්විතියික මට්ටමේ නිලධාරීන් 09 ක් සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරි 03 ක් සඳහා ද පුරප්පාඩු පැවතුණි.

(ආ) ද්විතික මට්ටම යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ තනතුර සඳහා අනුමත කාර්ය මණ්ඩලය 02ක් වුවද 2024 දෙසැම්බර් 31 දිනවන විට තත්‍ය කාර්ය මණ්ඩලය 03ක් වූ හෙයින් එක් නිලධාරියෙකු අතිරික්තව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී ආනයන බලපත්‍ර ලබා දීම සඳහා පරිගණක වැඩසටහනක් හඳුන්වා දී ක්‍රියාත්මක කර තිබුණු බැවින් සත්‍ය සේවක අවශ්‍යතාවය පිළිබඳ නැවත ඇගයීමක් සිදුකර කාර්යය මණ්ඩල සංශෝධනයක් සිදු කිරිමට කටයුතුකර නොතිබුණි.

ඊ් එම්.කේ.එම්.පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ඊ. එම්. කේ. එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල.